IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

## 2015

# மனிதவள மேம்பாட்டு நிறுவகம்
# கொழும்புப் பல்கலைக்கழகம், ஸ்ரீலங்கா

## ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்

## 2015

# INSTITUTE OF HUMAN RESOURCE ADVANCEMENT
# UNIVERSITY OF COLOMBO, SRI LANKA

## ANNUAL REPORT AND ANNUAL ACCOUNTS
## 2015

## පටුන


| අංකය | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 01. | **හැඳින්වීම** | 1 - 2 |
| 01.1 | 2015 වර්ෂයේදී මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන් | |
| 02. | **දැක්ම** | 3 |
| 03. | **මෙහෙවර** | 4 |
| 04. | **අධ්‍යක්ෂ සමාලෝචනය** | 5 |
| 05. | **කළමනාකරණය** | 6 - 10 |
| 05.1 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන ව්‍යුහය | |
| 05.2 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල සහ කමිටු | |
| 05.3 | ශාස්ත්‍රීය කමිටුව | |
| 05.4 | අධ්‍යයන මණ්ඩල තොරතුරු | |
| 05.5 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු තොරතුරු | |
| 06. | **2015 වර්ෂයේ මා.ස.අ. ආයතනයේ අධ්‍යයන වැඩසටහන් කාර්ය සාධනය** | 10 - 17 |
| 06.1 | අධ්‍යයන වැඩසටහන් | |
| 06.1.1 | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය (BLE) | |
| 06.1.2 | පශ්චාත් උපාධි පාඨමාලාවන් | |
| 06.1.3 | විධායක ඩිප්ලෝමා වැඩසටහන් | |
| 06.1.4 | ඩිප්ලෝමා වැඩසටහන් | |
| 06.1.5 | සහතිකපත්‍ර වැඩසටහන් | |
| 06.2 | 2015 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළු විස්තර | |
| 06.2.1 | මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද වැඩමුළු | |
| 06.2.2 | මානව සම්පත් අභිවර්ධන ආයතන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | |
| 06.3 | පර්යේෂණ, නවයජනන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | |

| | | |
|---|---|---|
| 07. | **අධ්‍යයන කාර්ය මණ්ඩල, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු** | |
| 07.1 | 2015 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු | 18 - 20 |
| 07.2 | 2015 වර්ෂයේ විධායක කාර්ය මණ්ඩලයේ තොරතුරු | |
| 07.3 | 2015 වර්ෂයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු | |
| 07.4 | 2015 වර්ෂය තුළ පැවරුම් පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලයේ තොරතුරු | |
| 08. | **පුස්තකාලය** | |
| 08.1 | පුස්තකාලයෙන් සම්පාදනය කරනු ලබන සේවාවන් | 20 - 21 |
| 08.2 | පුස්තකාල සාමාජික තොරතුරු | |
| 08.3 | 2015 වසරේ පුස්තකාලයේ ආදායම | |
| 09. | **ඒකක/ දෙපාර්තමේන්තු** | |
| 09.1 | මානව සම්පත් කළමනාකරණ ඒකකය | 21 - 23 |
| 09.2 | සේවා කළමනාකරණ අංශය | |
| 09.3 | ව්‍යාප්ති වැඩසටහන් අංශය | |
| 09.4 | භාෂා ඒකකය | |
| 09.4.1 | ඉංග්‍රීසි භාෂා අංශය | |
| 09.4.2 | දමිළ භාෂා අංශය | |
| 09.5 | තොරතුරු තාක්ෂණවේද ඒකකය | |
| 09.5.1 | සිස්කෝ ජාලකරණ විද්‍යායතනය | |
| 09.5.2 | මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණවේද ඇකඩමිය | |
| 10. | **2015 වර්ෂය තුළ ආයතනය මුදුන්පත් කරගත් අරමුණු** | 23 - 24 |
| 11. | **මූල්‍ය ක්‍රියාකාරකම්** | |
| | 2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 25 - 56 |
| | 2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ කාර්ය සාධනය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය | |
| | විගණකාධිපති වාර්තාව | |
| | 2015 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස් | |

# මානව සම්පත් අභිවර්ධන ආයතනය (මා.ස.අ.ආ.)
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## වාර්ෂික වාර්තාව - 2015

## 01. හැඳින්වීම

1978 විශ්වවිද්‍යාල පනත යටතේ 2006 නියමාවලිය මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනය ස්ථාපිත කරන ලද අතර එය දිවයිනේ ශ්‍රමික ප්‍රජාව උදෙසා ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන එකම අධ්‍යාපනික ආයතනය වේ. 1979.12.26 දින පනත් අංක 68/10 ට අනුව ස්ථාපනය කරන ලද සේවක අධ්‍යාපන ආයතනය 2006.06.22 දින පනත් අංක 01/2006 මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදි.

දශකයකට වඩා වැඩි කාලයක් පුරා මානව සම්පත් අභිවර්ධන ආයතනය වැඩිහිටි අධ්‍යාපන, පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් තුළින් විශාල අත්දැකීම් සම්භාරයක් එක්රැස් කොට ගෙන තිබේ. ආයතනයේ බොහෝමයක් ආචාර්යවරුන් බාහිර සම්පත් සම්පාදකයින් වන අතර ඔවුහු තම විෂයාංශයන්හි විශේෂඥයෝ වෙති.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව ආයතනයේ ප්‍රථම අධ්‍යයන වැඩසටහන වන අතර එය දැනුම් සේවකයාගේ වත්මන් අවශ්‍යතාවන්ට මුහුණ දිය හැකි පරිදි අවශ්‍ය වෙනස්කම්වලින් යුක්තව නව්‍යකරණය කොට ඇත.

මානව සම්පත් අභිවර්ධන ආයතනය සාපේක්ෂව නව්‍ය ආයතනයක් වුවත් එය විශාල ශිෂ්‍ය සංඛ්‍යාවකින් යුක්ත වේ. 2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් එක් උපාධි පාඨමාලාවක්, පශ්චාත් උපාධි පාඨමාලා 05 ක්, ඩිප්ලෝමා පාඨමාලා 13 ක් සහ සහතිකපත් පාඨමාලා 11 ක් ශ්‍රී ලාංකේය ශ්‍රමික ප්‍රජාව සහ පාසල් අධ්‍යාපනය හමාර කළ සිසුන් උදෙසා පිරිනමන ලදි. (වගුව අංක 1.1 2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්)

## 01.1 2015 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන්

| අංකය | පාඨමාලා වර්ගය | පාඨමාලාවේ නම |
|---|---|---|
| 01 | උපාධි වැඩසටහන | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය, ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමාව |
| 02 | පශ්චාත් උපාධි වැඩසටහන් | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 03 | | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව |
| 04 | | සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව |
| 05 | | භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව |
| 06 | | ආපදා විශ්ලේෂණ කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව |
| 07 | විධායක ඩිප්ලෝමා | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 08 | | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 09 | | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 10 | | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 11 | | සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව |
| 12 | | ශ්‍රව්‍ය- දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව |
| 13 | ඩිප්ලෝමා | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව |
| 14 | | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව |
| 15 | | උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව |
| 16 | | වෛද්‍ය රසායනාගාර විද්‍යා ඩිප්ලෝමාව |
| 17 | | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව |
| 18 | | තොරතුරු තාක්ෂණවේදී කළමනාකරණ ඩිප්ලෝමාව |
| 19 | | කළමනාකරණ ඩිප්ලෝමාව |
| 20 | සහතිකපත් පාඨමාලා | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 21 | | ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව |
| 22 | | ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව |
| 23 | | කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 24 | | පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව |
| 25 | | පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව |
| 26 | | කළමනාකරණ සහතිකපත් පාඨමාලාව |
| 27 | | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික |
| 28 | | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම |
| 29 | | ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව |
| 30 | | සී.සී.එන්.ඒ. පාඨමාලාව |

## 02. දැක්ම

# දැක්ම

අභියෝගාත්මක

ගෝලීය තත්වයනට

මුහුණ දිය හැකි

සහ

අපගේ ජාතික සංවර්ධනයේ

මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත සහ

බුද්ධිමත්

දැනුම-භාවිතකරන්නන්

ලෙසින්

මානව සම්පත

අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇප කැප වූ

ඉහළම තත්වයේ

පිළිගත් ආයතනයක්

බවට පත්වීම.

## 03. මෙහෙවර

# මෙහෙවර

"උපයමින් ඉගෙනීම" කරන
සේව්‍ය, සේවක සහ ව්‍යවසායක වූ
සේවා-කාණ්ඩ සඳහා තම හැකියාවන් ඉහළ නැංවීමට
පූර්ණ තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ
ඉහළ මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට
පහසුකම් සපයමින් මග පෙන්වීම.

ඔවුන්ගේ විචාරාත්මක සහ තර්කානුකූලව සිතීමේ හැකියාව,
ආචාරධර්ම, ප්‍රමිතීන්, ව්‍යවසාය දක්ෂතා, නායකත්ව ලක්ෂණ සහ
යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බව
අවබෝධ කොට ගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය
කර ගැනීමට තව දුරටත් මග පෙන්වීම.

දේශයේ "දැනුම්-ආර්ථිකය"
සඳහා
බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක්
දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස
පෙළ ගැසුණු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට කැපවීම.

## 04. අධ්‍යක්ෂ සමාලෝචනය

2015 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මම මහත් භාග්‍යයක් කොට සලකමි. මෙම කාල වකවානුවේදිත් අධ්‍යයන වපසරිය තුළ සාමාන්‍ය මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක අධ්‍යාපනය සම්පාදනය කරන්නා වූ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් නොකඩවා ජාතියට සේවා සම්පාදනය කෙරිණ. මෙම වර්ෂයේදී සැලකිය යුතු විශේෂතම කාරණය නම්, ශාස්ත්‍රීය කමිටුවේ මග පෙන්වීම යටතේ අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමට මූලික පියවර ගැනීමයි.

2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රමුඛතම වැඩසටහන වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සඳහා ආසන්න වශයෙන් නවක විද්‍යාර්ථීන් 208 ක් ලියාපදිංචි වූ අතර සමස්තයක් ලෙස එම වැඩසටහන තුළ අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව 516 කි. තව දුරටත් ආසන්න වශයෙන් 428 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් හෝ වෘත්තික මට්ටමේ ශිෂ්‍ය පිරිසක් පශ්චාත් උපාධි පාඨමාලා 05 ක අධ්‍යයන කටයුතුවල නිරත වූ අතර එම අධ්‍යයන වැඩසටහන් නම්: ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව, තොරතුරු විද්‍යාපති පාඨමාලාව සහ ආපදා කළමනාකරණ විශ්ලේෂණ සහ පාලන විද්‍යාපති පාඨමාලා වේ.

2015 වර්ෂයේදී තමන් සතු විෂයානුබද්ධ දැනුම පුළුල් කර ගැනීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 606 ක් වන අතර ශිෂ්‍යයෝ 6470 ක් සහතික පත්‍ර පාඨමාලාවන් සඳහා පසුගිය වසර තුළ ලියාපදිංචි වූහ. 2015 වසර තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් වෘත්තියමය රාමුව තුළ දැනුම වර්ධනය උදෙසා පවත්වන ලද වැඩමුළු සංඛ්‍යාව 22 ක් වන අතර ශිෂ්‍යයෝ 1353 ක් එම වැඩමුළු සඳහා සහභාගි වූහ.

2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය නව කළමනාකරණ ඩිප්ලෝමාවක් හඳුන්වා දුන් අතර ඒ සඳහා සිසුහු 22 ක් ලියාපදිංචි වූහ. තවද, ආයතනය බාහිර පාර්ශවයන් හා එක්ව පවත්වාගෙන යනු ලැබූ සහයෝගීත්ව අධ්‍යයන වැඩසටහන් කිහිපයක් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් නවතා දැමීමට කටයුතු කෙරිණ.

2016 වසර මානව සම්පත් අභිවර්ධන ආයතනයට නව ආරම්භයක් ලෙස සැලකීමට අපි බලාපොරොත්තු වෙමු. මෙම වසර මානව සම්පත් සේවා සම්පාදනය සහ එහි නිමැවුම් ගුණාත්මකභාවය සංවර්ධන වසර ලෙස හඳුන්වමු. අපගේ විශ්වාසය 2016 වසර පෙර මෙන්ම අපගේ සමාජ ප්‍රගතිය උදෙසා අපට කළ හැකි සහ කළ යුතු දේ වෙනුවෙන් අප මග පෙන්වන බවයි. අප සොයන ප්‍රගතිය දිගින් දිගටම, ක්‍රමිකව අපගේ පාර්ශවකරුවන්ට සෙත සලසනු ඇත. අතීතයේ මෙන්ම අප ළඟා කර ගැනීමට අපේක්ෂා කරන්නා වූ ප්‍රගතිය තුළින් අපේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන අභිලාෂයන් අපි සාකල්‍යව වැළඳ ගෙන ඇත්තෙමු. 2016 වසර අවසන් වන විට අපගේ ජාතියේ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට දායක වන මානව සම්පත් අභිවර්ධන ආයතනික ප්‍රජාව වන අපි 2016 අවසන් වන විට සතුටු විය හැකි පිරිසක් ලෙසින් ස්වයං අභිමානයෙන් නැඟී සිටිමු.

**මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි**
**අධ්‍යක්ෂ**

## 05. කළමනාකරණය


මානව සම්පත් අභිවර්ධන ආයතන ශාස්ත්‍රීය මණ්ඩලයේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ අධ්‍යයන සහ පරිපාලන පූර්ණ කාලීන ප්‍රධාන විධායක නිලධාරියා වේ.

අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය මණ්ඩලයේ සභාපතිවරයා වන අතර ආයතනික අධ්‍යයන කමිටුවේ නිලබලයෙන් පත් වූ නිලධාරියෙක් ද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා වන අතර, ආයතනයේ ශික්ෂණය පවත්වාගෙන යාමේ වගකීම් දරන්නා ද වේ.


2015 වර්ෂයේ ආයතන කළමනාකරණයේ වෙනස්වීම් කිහිපයක් සිදු වූ අතර, ඒ අනුව ආයතනයට වැඩබලන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් තෝරා පත් කර ගැනිණ. 2014 අගෝස්තු 19 වන දින සිට 2015 ජනවාරි 18 වන දින තෙක් එම්.ජී.ජී. හේමකුමාර මහතා කටයුතු කළ අතර, 2015 ජනවාරි 19 වන දින සිට 2015 මැයි 26 වන දින තෙක් මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න මහතා සේවය කළේය. 2015 මැයි 27 වන දින සිට අගෝස්තු 24 වන දින තෙක් මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති මහතා වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස සේවය කළේය.

2015 අගෝස්තු 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි වසර තුනක කාලයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ සහ සංවිධාන අධ්‍යයන අංශයේ සහාය මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා ආයතන අධ්‍යක්ෂවරයා ලෙස තේරී පත් විය.

### 05.1 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලන ව්‍යුහය



## 05.2 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල සහ කමිටු




## 05.3 ශාස්ත්‍රීය කමිටුව

ශාස්ත්‍රීය කමිටුව ව්‍යවස්ථාපිත මණ්ඩලයකින් සමන්විත වන අතර එහි සාමාජිකයන්ගේ විස්තර පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය එච් ඩී කරුණාරත්න මහතා | සභාපති වැ.බ. (2015 ජනවාරි මස සිට 2015 මැයි මස දක්වා) |
| 02 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 03 | මහාචාර්ය ඩබ් චන්ද්‍රදාස මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 04 | මහාචාර්ය කේ ආර් ආර් මහානාම | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 05 | ආචාර්ය පාලිත මහිපාල මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 06 | මේජර් ජෙනරාල් කේ හෙන්දවිතාරණ මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 07 | ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 08 | ආර් ඒ යූ රණවීර මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 09 | කේ ආර් උඩුවාවෙල මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 10 | භද්‍රානි ජයවර්ධන මහත්මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 11 | කේ ගමගේ මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 12 | ඒ පී ගුණරත්න මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 13 | ඒ එම් පී එම් බී අතපත්තු මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |
| 14 | එම් ජී පී හේමකුමාර මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 15 | ආචාර්ය සී එම් එදිරිසිංහ මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 16 | කේ පී මාතොටආරච්චි මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 17 | බී කේ පී අබේසූරිය මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |

2015 මැයි මස 13 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවුරුදු 03 ක් කාලයක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නව සාමාජික මණ්ඩලයක් පත් කරන ලද අතර ඔවුන්ගේ තොරතුරු පහත සඳහන් කොට ඇත.

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ කේ ඩී එස් ජයනෙත්ති මහතා<br>මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති වැ.බ. (2015 ජූනි මස සිට 2015 අගෝස්තු මස දක්වා)<br>සභාපති (2015 සැප්තැම්බර් මස සිට) |
| 02 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 03 | මහාචාර්ය ඩබ් චන්ද්‍රදාස මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 04 | මහාචාර්ය කේ ආර් ආර් මහානාම මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| 05 | මහාචාර්ය කේ ගුණවර්ධන මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 06 | මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 07 | මහාචාර්ය නයනි මෙලගොඩ මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 08 | මහාචාර්ය එම් සෝමතිලක මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 09 | ආචාර්ය දිනූකා විජේතුංග මිය | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 10 | එච් එම් එන් වරකාඋල්ල මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 11 | එන් සෙල්වකුමාරන් මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 12 | ඩී එම් එස් දසනායක මහතා | වි. ප්‍ර. කො. සභාව විසින් පත් කරන ලද සාමාජික |
| 13 | කේ ඒ විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |
| 14 | එම් පී පී හේමකුමාර මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 15 | කේ පී මාතොටආරච්චි මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| 16 | බී කේ පී අබේසූරිය මහත්මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |

## 05.4 අධ්‍යයන මණ්ඩල තොරතුරු

අධ්‍යයන මණ්ඩල සාමාජික තොරතුරු පහත දක්වා ඇත.

- **මානව සම්පත් අධ්‍යාපන අධ්‍යයන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | එම් පී පී හේමකුමාර මහතා | සභාපති |
| 02 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 03 | ආචාර්ය එන් එන් ජේ නවරත්න මහතා | සාමාජික |
| 04 | කේ පී මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 05 | ආචාර්ය ඩී ඒ සී සිල්වා මහතා | සාමාජික |
| 06 | ආචාර්ය එස් කෝපරහේවා මහතා | සාමාජික |

- **ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | කේ පී මාතොටආරච්චි මහත්මිය | සභාපති |
| 02 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 03 | එම් පී පී හේමකුමාර මහතා | සාමාජික |
| 04 | කේ ඩී එන් හේවගේ මහතා | සාමාජික |
| 05 | කේ ගමගේ මහතා | සාමාජික |

- **භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | බී කේ පී අබේසූරිය මහත්මිය | සභාපති |
| 02 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සාමාජික (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 03 | එල් පී ආරියසේන මහතා | සාමාජික |
| 04 | ඩබ් ඩබ් ඩී සිල්වා මහතා | සාමාජික |
| 05 | ඩබ් ජයවර්ධන මිය | සාමාජික |

## 05.5 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කමිටු තොරතුරු

- **විගණන කමිටුව (ස්වාධීන කමිටුවකි)**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ඩබ් චන්ද්‍රදාස මහතා | සභාපති |
| 02 | මහාචාර්ය කේ ගුණවර්ධන මහතා | සාමාජික |
| 03 | එච් එම් එන් වරකාළුල්ල මහතා | සාමාජික |
| 04 | කේ ඒ විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |

- **ප්‍රසම්පාදන කමිටුව**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 02 | එම් පී පී හේමකුමාර මහතා | සාමාජික |
| 03 | ජේ එස් වී එන් ටී සොයිසා මිය | සාමාජික |
| 04 | එච් පී ඩී ශ්‍රියානි මෙය | සාමාජික |

- **මූල්‍ය කමිටුව**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 02 | ජේ එස් වී එන් ටී සොයිසා මිය | සාමාජික (ලේකම්) |
| 03 | ඩී එම් එස් දසනායක මහතා | සාමාජික |
| 04 | එම් පී පී හේමකුමාර මහතා | සාමාජික |
| 05 | කේ පී මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 06 | බී කේ පී අබේසූරිය මහත්මිය | සාමාජික |
| 07 | එච් පී ඩී ශ්‍රියානි මෙය | සාමාජික |

- **පුස්තකාල කමිටුව**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 02 | ආර් එම් එස් එන් රත්නායක මිය | සාමාජික (ලේකම්) |
| 03 | එම් පී පී හේමකුමාර මහතා | සාමාජික |
| 04 | කේ පී මාතොටආරච්චි මහත්මිය | සාමාජික |
| 05 | ආර් එම් බී රාජපක්ෂ මහතා | සාමාජික |
| 06 | කේ ඩී එන් හේවගේ මහතා | සාමාජික |
| 07 | එච් පී ඩී ශ්‍රියානි මෙය | සාමාජික |
| 08 | ජේ එස් වී එන් ටී සොයිසා මිය | සාමාජික |
| 09 | ඩී සී පෙරේරා මිය | සාමාජික |
| 10 | වී එන් පී ලියනගේ මහතා | සාමාජික |
| 11 | ප එන් සී පෙරේරා මහතා | සාමාජික |
| 12 | පී බී පී ඩී ඩී සිල්වා මහතා | සාමාජික |

- **ගොඩනැගිලි කමිටුව**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය ජේ ඒ එස් කේ ජයකොඩි මහතා | සභාපති (අධ්‍යක්ෂ/මා.ස.අ.ආ.) |
| 02 | එච් පී ඩී ශ්‍රියානි මෙය | සාමාජික |
| 03 | එච් එම් එන් වරකාඋල්ලේ මහතා | සාමාජික |
| 04 | කේ ඒ විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |

- **පර්යේෂණ කළමනාකරණ කමිටුව**

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය කේ ආර් ආර් මහානාම මහතා | පීඨාධිපති/ විද්‍යා පීඨය |
| 02 | මහාචාර්ය ඩබ් චන්ද්‍රදාස මහතා | පීඨාධිපති/ අධ්‍යාපන පීඨය |
| 03 | මහාචාර්ය අතුල රණසිංහ මහතා | පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය |

## 06. 2015 වර්ෂය තුළ මා.ස.අ. ආයතනයේ කාර්ය සාධනය

### 06.1 අධ්‍යයන වැඩසටහන්

2015 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් අංක 01.1 සටහනේ දක්වන ලද අධ්‍යයන වැඩසටහන් 30 ක් කාණ්ඩ 05 ක් යටතේ පවත්වන ලදි. ඒවා නම්:

1) උපාධි වැඩසටහන
2) පශ්චාත් උපාධි වැඩසටහන්
3) විධායක ඩිප්ලෝමා වැඩසටහන්
4) ඩිප්ලෝමා වැඩසටහන්
5) සහතිකපත්‍ර වැඩසටහන්

### 06.1.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය (BLE)

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය වසර 36 ක් පුරා රාජ්‍ය භාණ්ඩාගාර අනුග්‍රහය මගින් පවත්වාගෙන යනු ලබන එකම අධ්‍යයන වැඩසටහන වේ. මෙම වැඩසටහන උපාධිය සහ ඩිප්ලෝමාව වශයෙන් ප්‍රධාන අංග දෙකකින් (02) සමන්විතය. උපාධි පාඨමාලාවේ කාලය වසර 03 ක් එනම්, අධ්‍යයන සෙමෙස්තර 06 කින් සමන්විතය. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අය උපාධි පළමු වසර සඳහා බඳවා ගැනීමට අධ්‍යයන සෙමෙස්තර 02 කින් යුත් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවත් ඊට අදාළ පරීක්ෂණත් සම්පූර්ණ කළ යුතුය. මෙම උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා ඇතුළත් වීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය යන දෙකම සමත් විය යුතුය.


2015 වර්ෂය තුළ මෙම අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම් සඳහා ලියාපදිංචි වූ සමස්ත විද්‍යාර්ථීන් සංඛ්‍යාව 516 කි. වර්ෂය තුළ වැඩසටහන සඳහා විද්‍යාර්ථීන් 157 ක් බඳවා ගත් අතර එය 2014 වර්ෂය හා සැසඳීමේදී 15% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.


වැඩසටහනේ පසුගිය වසර පහ (05) විශ්ලේෂණයේදී 2011 වසරේ සිට 2014 වසර දක්වා ශිෂ්‍ය බඳවා ගැනීමේ අඩුවීමක් පෙන්නුම් කළද 2015 වසරේදී නැවතවරක් එහි වැඩිවීමක් පෙන්නුම් කරයි.

## 2011 - 2015 කාලය තුළ ශ්‍රම අධ්‍යාපනවේදි වැඩසටහනේ කාර්ය සාධනය

| වැඩසටහන | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | උපාධිධාරී/ සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[1] | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| ශ්‍රම අධ්‍යාපනවේදි උපාධිය | 111 | 221 | 189 | 137 | 157 | 150 | 112 | 153 | 153 | 119 |
| ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමාව | 60 | 54 | 55 | 59 | 51 | 37 | 37 | 49 | 37 | 42 |


## ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ කාර්ය සාධනය : 2011 - 2015





මූලාශ්‍රය : සමීක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

## ශ්‍රම අධ්‍යාපනවේදි ඩිප්ලෝමා පාඨමාලාවේ කාර්ය සාධනය : 2011 - 2015




මූලාශ්‍රය : සමීක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

[1] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සියුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.


### 06.1.2 පශ්චාත් උපාධි පාඨමාලා


2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් විවිධ අධ්‍යයන පථයන් ආවරණය කරමින් පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් පවත්වන ලදි. මෙම වැඩසටහන්, කළමනාකරුවන්ට ඔවුන්ගේ විෂය පථයන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම අරමුණු කොට ඇත. වර්ෂය තුළ ආයතනය විසින් පවත්වන ලද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති සමස්ත වෘත්තිකයන් සංඛ්‍යාව 428 කි. එහි වැඩිම ශිෂ්‍ය ලියාපදිංචිය පෙන්නුම් කොට ඇත්තේ පිළිවෙලින් ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති පශ්චාත් උපාධි සහ මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවලිනි.

**2012 - 2015 කාලය තුළ පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය**

| වැඩසටහන | | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | උපාධිධාරී ශිෂ්‍ය සංඛ්‍යාව[2] | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2012 | 2013 | 2014 | 2015 |
| 01 | ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධිය | 104 | 162 | 160 | 172 | - | - | 155 | 87 |
| 02 | මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | 181 | 173 | 146 | 135 | 64 | 64 | 113 | 85 |
| 03 | සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | 114 | 114 | 112 | 121 | - | - | - | 43 |
| 04 | භූ විද්‍යා තොරතුරු විද්‍යාපති පාඨමාලාව | 51 | 50 | 51 | - | - | 11 | 07 | 07 |
| 05 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ සහ පාලන විද්‍යාපති පාඨමාලාව | 65 | - | 50 | - | - | - | 25 | 25 |
| | එකතුව | **515** | **499** | **519** | **428** | **64** | **75** | **300** | **247** |

**පශ්චාත් උපාධි වැඩසටහන්වල කාර්ය සාධනය : 2012 - 2015**




මූලාශ්‍රය : සම්ක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

[2] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ හෝ උපාධිලත් සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.


## 06.1.3 විධායක ඩිප්ලෝමා වැඩසටහන්


දිවයින පුරා සිටින වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිය විෂය ක්ෂේත්‍රයන්හි විෂය ප්‍රාගුණ්‍ය සුදුසුකම් ලබා ගැනීමට විධායක ඩිප්ලෝමාවන් ඉතාමත් සුදුසු වේ. රැකියා ක්ෂේත්‍රය තුළ මධ්‍යම මට්ටමේ වෘත්තිකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් නිර්මාණය කොට ඇත. මෙම වැඩසටහන්වල මූලික අරමුණ වන්නේ කළමනාකරණ වෘත්තිකයන්ට ඔවුන් නියුක්ත වන සේවා අංශයන්හි විශේෂිත දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීමයි. ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ ශ්‍රව්‍ය- දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව යන අධ්‍යයන වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීමේ අරමුණින් නවතා දැමීමට කටයුතු කෙරිණ.

**2012 - 2015 කාලය තුළ විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය**

| වැඩසටහන | | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[3] | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2012 | 2013 | 2014 | 2015 |
| 01 | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව | 81 | 81 | 83 | 94 | - | 62 | 50 | 59 |
| 02 | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 75 | 68 | 95 | 113 | 40 | 38 | 34 | 61 |
| 03 | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | 45 | 43 | - | - | - | 25 | - |
| 04 | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | - | 29 | 31 | - | - | - | 13 |
| 05 | සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | - | - | - | 35 | - | - | - | - |
| 06 | ශ්‍රව්‍ය-දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ උසස් ඩිප්ලෝමාව | - | - | 38 | - | - | - | - | - |
| | එකතුව | **156** | **194** | **288** | **273** | **40** | **100** | **109** | **133** |

**විධායක ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය : 2012 - 2015**




මූලාශ්‍රය: සමීක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

[3] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.


## 06.1.4 ඩිප්ලෝමා වැඩසටහන්


මෙම වැඩසටහන් මූලික, ද්විතියික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට ඔවුන්ගේ වෘත්තිය ජීවිතය තුළ තමන්ගේ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියා ඔප්නැංවීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීමේ හැකියා වර්ධනය කිරීම අරමුණු කොට ගෙන නිර්මාණය කොට ඇත. බාහිර පාර්ශවයන් සමග සහයෝගිව දියත් කරන ලද ඇතැම් අධ්‍යයන පාඨමාලා ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් 2015 වර්ෂය තුළදී තාවකාලිකව නවත්වා ඇත.

**2012 - 2015 කාලය තුළ ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය**

| වැඩසටහන | | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[4] | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2012** | **2013** | **2014** | **2015** | **2012** | **2013** | **2014** | **2015** |
| 01 | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව | 105 | 72 | - | 58 | - | - | 7 | 23 |
| 02 | මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව | - | 44 | - | 50 | - | - | 32 | 11 |
| 03 | උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව | 30 | 25 | 50 | 34 | 28 | 25 | 36 | 24 |
| 04 | වෛද්‍ය රසායනාගාර විද්‍යා ඩිප්ලෝමාව | - | 45 | - | - | - | - | - | 16 |
| 05 | සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමාව | - | 62 | - | - | - | - | 37 | - |
| 06 | ජාත්‍යන්තර ව්‍යාපාරවේදී ඩිප්ලෝමාව | - | 29 | - | - | - | - | 21 | - |
| 07 | අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව | 139 | 120 | 120 | 163 | 91 | 96 | - | 93 |
| 08 | තොරතුරු තාක්ෂණවේදී කළමනාකරණ ඩිප්ලෝමාව | - | - | 57 | - | - | - | - | - |
| 09 | තොරතුරු තාක්ෂණවේදී ඩිප්ලෝමාව | - | - | - | 06 | - | - | - | 06 |
| 10 | කළමනාකරණ ඩිප්ලෝමාව | - | - | - | 22 | | | | |
| | එකතුව | **274** | **397** | **227** | **333** | **119** | **121** | **133** | **173** |

**ඩිප්ලෝමා වැඩසටහන්වල කාර්ය සාධනය : 2012 - 2015**




මූලාශ්‍රය : සම්ක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

[4] උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.


## 06.1.5 සහතිකපත්‍ර වැඩසටහන්


ශිෂ්‍යයින්ට ඔවුන්ගේ වෘත්තිය ප්‍රවේශයට යොමු වීම සඳහා මූලික සුදුසුකම් ලබා ගැනීම උදෙසා පවත්වනු ලබයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් වසර 30 කට වඩා කාලයක් පුරා පවත්වාගෙන යයි. 2015 වසර තුළ සහතිකපත්‍ර පාඨමාලාවන් 11 ක් පැවැත්විණ. ඉන් 05 ක් විවිධ මට්ටම් සඳහා වූ ඉංග්‍රීසි භාෂා පාඨමාලා විය. ඊට අමතරව, දමිළ භාෂා පාඨමාලාවක්, කළමනාකරණ පාඨමාලාවක් සහ තොරතුරු තාක්ෂණවේදී පාඨමාලා 02 ක් පවත්වන ලදී. 2015 වර්ෂය සඳහා සමස්ත ශිෂ්‍ය බඳවා ගැනීම 6470 ක් විය. එය පසුගිය වසර 4 ක කාලය තුළ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි.

**2012 - 2015 කාලය තුළ සහතිකපත්‍ර වැඩසටහන්වල කාර්ය සාධනය**

| වැඩසටහන | | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව[5] | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2012 | 2013 | 2014 | 2015 | 2012 | 2013 | 2014 | 2015 |
| 01 | ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 2986 | 2737 | 2206 | 2149 | 2737 | 2392 | 1665 | 1688 |
| 02 | ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව | 340 | 141 | 259 | 187 | 225 | 229 | 132 | 120 |
| 03 | ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 112 | 74 | 99 | 99 | 105 | 71 | 67 | 62 |
| 04 | කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | 740 | 570 | 1707 | 1705 | 325 | 540 | 544 | 1261 |
| 05 | පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | - | 60 | 215 | 251 | - | - | 45 | 314 |
| 06 | පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව | 230 | 471 | 549 | 354 | - | 167 | 213 | 246 |
| 07 | කළමනාකරණ සහතිකපත් පාඨමාලාව | 32 | 20 | 92 | 59 | 19 | 12 | 11 | 54 |
| 08 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික | 634 | 749 | 658 | 316 | 444 | 503 | - | 411 |
| 09 | දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම | 301 | 251 | 322 | 262 | 147 | 197 | - | 200 |
| 10 | ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව | - | 452 | - | 1051 | - | 392 | - | 579 |
| 11 | සී.සී.එන්.ඒ. පාඨමාලාව | - | 98 | 103 | 37 | - | 48 | 14 | 31 |
| | එකතුව | **5375** | **5623** | **6210** | **6470** | **4002** | **4551** | **2691** | **4906** |

**සහතිකපත්‍ර වැඩසටහන්වල කාර්ය සාධනය : 2012 - 2015**




මූලාශ්‍රය : සමීක්ෂිත දත්ත, 2011 - 2015, මා.ස.අ.ආ.

[5] *උක්ත වගු සහ ප්‍රස්තාර මගින් දක්වා ඇති දත්ත අදාළ වසර තුළ සුදුසුකම් සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව දක්වයි. එය අදාළ වර්ෂයේ වාර්ෂික බඳවා ගැනීමට අදාළ නොවේ.*

## 06.2 2015 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩමුළු විස්තර

### 06.2.1 මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද වැඩමුළු

2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා වැඩසටහන් මගින් පුහුණු වැඩසටහන් 22 ක් පවත්වන ලදි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත ආයතනික ශිෂ්‍ය ප්‍රජාවගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම අරමුණු කොට මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණ.

- **මානව සම්පත් කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු**

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|---|
| කොත්මලේ | මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 2015 මාර්තු 03 - 06 | ව්‍යාපාර සන්නිවේදනය | 80 |
| කොත්මලේ | මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | 2015 මාර්තු 28, 29 | උපාය මාර්ගික කළමනාකරණය | 123 |
| කොත්මලේ | ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | 2015 ජුනි 27,28 සහ 29 | මානව සම්පත් කළමනාකරණය | 119 |
| හලාවත | ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | 2015 ජුලි 30, 31 | උපාය මාර්ගික කළමනාකරණය | 98 |
| ඔරුතොට | මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව | 2015 සැප්තැම්බර් 19 - 22 | පුද්ගල සංවිධාන කළමනාකරණය | 126 |
| | | | **සමස්ත සහභාගිත්වය** | 546 |

- **සේවා කළමනාකරණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු**

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|---|
| කළුතර | සේවා කළමනාකරණ ඩිප්ලෝමාව | 2015 නොවැම්බර් 19 - 20 | එළිමහන් පුහුණු වැඩසටහන | 45 |
| කළුතර | සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 2015 දෙසැම්බර් 19 - 20 | එළිමහන් පුහුණු වැඩසටහන | 75 |
| | | | **සමස්ත සහභාගිත්වය** | 120 |

- **ව්‍යාප්ති වැඩසටහන් අංශය විසින් පවත්වන ලද වැඩමුළු**

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගි වූ ශිෂ්‍ය සඛ්‍යාව |
|---|---|---|---|---|
| දියතලාව | ආපදා විශ්ලේෂණ කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව | 2015 ජුනි 05, 06 සහ 07 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 50 |
| පොල්ගොල්ල | උපදේශන මනෝවිද්‍යා ඩිප්ලෝමාව | 2015 ජුනි 14 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 40 |
| දියතලාව | ආපදා විශ්ලේෂණ කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 2015 ජුනි 20, 21 | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව | 40 |
| එන්.පී.එල්.ටී. විද්‍යා පීඨය | ආපදා විශ්ලේෂණ කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව | 2015 අගෝස්තු 29 | කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් කළමනාකරණය | 40 |
| ඌව කුඩාඔය | භූ විද්‍යා තොරතුරු විද්‍යාපති පාඨමාලාව | 2015 ඔක්තෝබර් 03, 04 | අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකාව | 40 |
| කලුතර | ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 2015 ඔක්තෝබර් 24, 25 | එළිමහන් පුහුණු වැඩසටහන | 31 |
| මා.ස.අ.ආ. | ආපදා විශ්ලේෂණ කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාව | 2015 දෙසැම්බර් 13 | විශ්ලේෂණ ශිල්පීය ක්‍රම අධ්‍යයනය | 50 |
| | | | **සමස්ත සහභාගිත්වය** | 291 |

- **පුස්තකාලය විසින් පවත්වන ලද වැඩමුළු**

| ස්ථානය | පාඨමාලාව | දින/ දිනයන් | මාතෘකාව | සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මා.ස.අ.ආ. | පුස්තකාලය, | 2015 පෙබරවාරි 24 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 23 |
| මා.ස.අ.ආ. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 පෙබරවාරි 27 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 62 |
| එච්. ඒ. ආර්. ටී., කොළඹ 07 | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 අප්‍රේල් 24 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 57 |
| අධ්‍යාපන පීඨය, කොළඹ වි.වි. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 ජූනි 26 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 60 |
| අධ්‍යාපන පීඨය, කොළඹ වි.වි. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 අගෝස්තු 28 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 59 |
| අධ්‍යාපන පීඨය, කොළඹ වි.වි. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 සැප්තැම්බර් 09 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 28 |
| ශාස්ත්‍ර පීඨය, කොළඹ වි.වි. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 ඔක්තෝබර් 30 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 61 |
| අධ්‍යාපන පීඨය, කොළඹ වි.වි. | පුස්තකාලය, මා.ස.අ.ආ. | 2015 දෙසැම්බර් 11 | ආකල්ප සහ කුසලතා සංවර්ධන වැඩමුළුව | 46 |
| | | | සමස්ත සහභාගීත්වය | 396 |

## 06.2.2 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු

| වැඩසටහන | නම/ තනතුර | දිනය | සම්පත් සම්පාදනය |
|---|---|---|---|
| ජාතික පුස්තකාල අතර ශක්ති වර්ධනය කිරීම සහ සහයෝගිතාව සඳහා වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | ආ.එම්.එස්.එන්. රත්නායක මිය ජ්‍යෙ. සහකාර පුස්තකාලාධිපති | 2015 ජූනි 19 | ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| ගුණත්ව සහතිකකරණය පිළිබඳ වැඩමුළුව | මා.ස.අ. ආයතනික ආචාර්ය, විධායක සහ අනෙකුත් කාර්ය මණ්ඩලය | 2015 නොවැම්බර් 05 | ගුණත්ව සහතිකරණ ඒකකය, මා.ස.අ. ආයතනය |

## 06.3 පර්යේෂණ, නවප්‍රජනන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| පර්යේෂකයාගේ නම | මාතෘකාව (නිබන්ධය ඉංග්‍රීසි බසින් සිදු කෙරේ.) | දිනය | ස්ථානය/ප්‍රකාශනය |
|---|---|---|---|
| ඩබ්. එස්. චන්ද්‍රසේකර මයා | Mental Disorders and Stigma: Its Impact on help seeking behavior | 2015 ජූනි 08, 09 | මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ආසියානු ජර්නලය |
| එම්. පී. පී. හේමකුමාර මයා | Study on the knowledge dissent environment of public sector organizations | සැකසෙමින් පවතී | - |
| කේ. ඩී. එන්. හේවගේ මයා | Mathematical Modeling for forecasting and Prediction for lightning | සැකසෙමින් පවතී | - |
| කේ. පී. මාතොටආරච්චි මිය | The study on Impact of Personality types on job satisfaction | සැකසෙමින් පවතී | - |
| ආර්.එම්.එස්.එන්. රත්නායක මිය | Impact of Electronic Media on Reading Habits of teenagers in Sri Lanka: A Pilot Project | සැකසෙමින් පවතී | - |
| ඩී. සී. පෙරේරා මිය | An Empirical Analysis on the use of Information Technology for the success of the Secondary Educational Organizations in Sri Lanka | සැකසෙමින් පවතී | - |

# 07. අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු

## 07.01 2015 වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු

| නම | තනතුරු නාමය | විෂය | මාධ්‍යය |
|---|---|---|---|
| මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි | අධ්‍යක්ෂ/ මා.ස.අ. ආයතනය | - | - |
| එම්. පී. පී. හේමකුමාර මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ශ්‍රේණිය I | කළමනාකරණය සහ ගිණුම්කරණය | සිංහල සහ ඉංග්‍රීසි |
| කේ. පී. මාතොටආරච්චි මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ශ්‍රේණිය II | ආර්ථික විද්‍යාව | සිංහල සහ ඉංග්‍රීසි |
| කේ. ඩී. එන්. හේවගේ මයා | කථිකාචාර්ය (පරිවාස) | සංඛ්‍යානය සහ ගණිතය | සිංහල සහ ඉංග්‍රීසි |
| ඩබ්. එස්. චන්ද්‍රසේකර මයා (අධ්‍යයන නිවාඩු) | කථිකාචාර්ය (පරිවාස) | ප්‍රජා තොරතුරුවේදය | සිංහල සහ ඉංග්‍රීසි |
| ආර්.එම්.එස්.එන්. රත්නායක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති | - | - |

## 07.2 2015 වර්ෂයේ විධායක කාර්ය මණ්ඩලයේ තොරතුරු

| නම | තනතුරු නාමය | පාලන අංශය |
|---|---|---|
| එස්. සත්‍යසීලන් මයා (වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු) | නියෝජ්‍ය ලේඛකාධිකාරී | පරිපාලන සහ ආයතනික අංශය |
| ජේ. එස්. වී. එන්. ටී. සොයිසා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | මූල්‍ය අංශය |
| ඩී. සී. පෙරේරා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | විභාග අංශය |
| එච්. පී. ඩී. ශ්‍රියාණි මෙය | සහකාර ලේඛකාධිකාරී | පරිපාලන සහ ආයතනික අංශය |

## 07.3 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු - 2015

| අංකය | නම | තනතුරු නාමය | අංශය |
|---|---|---|---|
| 1 | එස්. කේ. මුදුන්කොටුව මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලඝුලේඛක) | පාලන අංශය |
| 2 | ඩී. ඩී. ඒ. මාලිනි මිය (මාර්තු දක්වා) | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍ය අංශය |
| 3 | ආර්. එම්. බී. මැණිකේ මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍ය අංශය |
| 4 | පී. එම්. එස්. පෙරේරා මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | විභාග අංශය |
| 5 | අයි. ඒ. පී. චන්ද්‍රමාලි මිය | ජේ. මාණ්ඩලික සහකාර (ලිපිකරු) | විභාග අංශය |
| 6 | එස්. එස්. රූපසිංහ මයා | මාණ්ඩලික සහකාර (ලිපිකරු) | මූල්‍ය අංශය |
| 7 | එස්. ඒ. පී. එම්. ගුණසේකර මෙය | ලිපිකරු - ශ්‍රේණිය I | මූල්‍ය අංශය |
| 8 | එස්. ඒ. පී. එන්. දිසානායක මිය | ලිපිකරු - ශ්‍රේණිය I | පාලන අංශය |
| 9 | ආර්. එම්. එම්. පී. කරුණාරත්න මයා | පොත් තබන්නා - ශ්‍රේණිය II | මූල්‍ය අංශය |
| 10 | ඒ. ඒ. සී. ටී. කරුණාරත්න මිය | පරිගණක යෙදවුම් සහකාර - ශ්‍රේණිය II | පාලන අංශය |
| 11 | ජේ. ඒ. ඩී. ගීතිකා මිය | පරිගණක යෙදවුම් සහකාර - ශ්‍රේණිය II | පාලන අංශය |
| 12 | පී. ජේ. වීරක්කොඩිආරච්චි මෙය | සරප් - ශ්‍රේණිය III | මූල්‍ය අංශය |
| 13 | එච්. ඩී. ජයවීර මයා | කම්කරු - වි. ශ්‍රේණිය | මූල්‍ය අංශය |
| 14 | ඩබ්.එච්.එස් සේනක මයා | රියදුරු - වි. ශ්‍රේණිය | පාලන අංශය |
| 15 | එම්.එස්.සී පෙරේරා මයා | බයිසිකල් පණිවිඩකරු | පාලන අංශය |
| 16 | කේ. පී. මුනිදාස තැලිස් මයා (මැයි මස දක්වා) | කම්කරු - ශ්‍රේණිය I | පුස්තකාලය |
| 17 | එම්. ඩී. එම්. යූ. සමරසේකර මයා | පුස්තකාල සහායක - ශ්‍රේණිය II | පුස්තකාලය |
| 18 | කේ. එල්. එම්. පියනන්ද මයා | කම්කරු - ශ්‍රේණිය II | පාලන අංශය |
| 19 | කේ. එම්. අයි. එම්. පෙරේරා මයා | කම්කරු - ශ්‍රේණිය III | විභාග අංශය |
| 20 | එස්. ඩී. එච්. යූ. සිරිරත්න මයා | කම්කරු - ශ්‍රේණිය III | පාලන අංශය |
| 21 | කේ.ඩී.පී කුරගම මයා | රියදුරු - ශ්‍රේණිය III (පරිවාස) | පාලන අංශය |

## 07.4 2015 වර්ෂය තුළ තාවකාලික පදනම මත සේවය කරන කාර්ය මණ්ඩලයේ තොරතුරු

| අංකය | නම | තනතුරු නාමය | අනුබද්ධිත අංශය |
|---|---|---|---|
| 1 | වී. එන්. පී. ලියනගේ මයා | අධ්‍යයන සමායෝජක - ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහන | ශ්‍ර.අ.අ. |
| 2 | පී. බී. පී. ඩී. ද සිල්වා මයා | උපදේශක - පරිගණක තාක්ෂණවේදය | සි.ජා.වි. |
| 3 | බී. කේ. පී. අබේසූරිය මිය | අධ්‍යයන සමායෝජක - ඉංග්‍රීසි භාෂා වැඩසටහන | ඉ.භා.අ. |
| 4 | ඊ. එන්. සී. පෙරේරා මයා | සම්බන්ධීකාරක - ව්‍යාප්ති පාඨමාලා වැඩසටහන | ව.වැ.අ. |
| 5 | කේ. ඒ. එම්. මදුරංග මයා | උපදේශක සහ පුහුණුකරු | සි.ජා.වි. |
| 6 | ටී. සුරේන්ද්‍රන් මිය | අධ්‍යයන සමායෝජක - දමිළ භාෂා වැඩසටහන | ද.භා.අ. |
| 7* | ඩී. ඒ. එස්. ඉන්ද්‍රානි මිය (අගෝස්තු සිට) | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 8* | ඒ. රූපසිංහ මෙය | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති සහකාර | සේ.ක.වැ.අ. |
| 9* | එස්. ඒ. පී. චන්ද්‍රකුමාර මයා (අගෝස්තු මස දක්වා) | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ සහකාර | පා.අ. |
| 10* | කේ. ඩී. ඩී. ගුණසේන මයා | ජ්‍යෙෂ්ඨ කාර්යාල සහායක | පා.අ. |
| 11 | පී. ඒ. ආර්. පී. අබේවර්ධන මෙය | පර්යේෂණ සහකාර | සේ.ක.වැ.අ. |
| 12 | ජේ. ඒ. ඩී. අයි. නිරංග මයා | පර්යේෂණ සහකාර (පුහුණු) | ශ්‍ර.අ.අ. |
| 13 | එස්. ඒ. කේ. ධර්මදාස මයා | තාක්ෂණික සහකාර | ව.වැ.අ. |
| 14 | යූ. බී. බණ්ඩාර මයා | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 15 | ජේ. එස්. එච්. ප්‍රියදර්ශන මයා | ව්‍යාපෘති සහකාර | සේ.ක.වැ.අ. |
| 16 | බී. එම්. සී. කුරේ මෙය | ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 17 | ඩබ්. ඒ. එන්. විදුරංග මයා | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |
| 18 | ඩී. වී. එම්. ආර්. දහනායක මිය | ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 19 | එච්. ඒ. එස්. වික්‍රමසිංහ මෙය | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 20 | පී. ඒ. ඩී. සී. රසංගිකා | ව්‍යාපෘති සහකාර | පුස්ත. |
| 21 | එන්. කේ. ඒ. ඒ. නිරෝෂන් මයා | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |
| 21 | කේ. පී. යූ. සංජීවනි මෙය | ව්‍යාපෘති සහකාර | ඉ.භා.අ. |
| 22 | එම්. අයි. ඉෆ්තිකාර් මයා | ව්‍යාපෘති සහකාර | සි.ජා.වි. |
| 23 | එස්. එල්. පී. විතානගේ මිය | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |
| 24 | ආර්. ඒ. එම්. ප්‍රියදර්ශනී | ව්‍යාපෘති සහකාර | පා.අ. |
| 25 | කේ. ටී. සී. කරුණානායක මෙය | ව්‍යාපෘති සහකාර | ද.භා.අ. |
| 26 | බී. කේ. ආර්. දුල්මි මෙය | ව්‍යාපෘති සහකාර | සේ.ක.වැ.අ. |
| 27 | කේ. එච්. දිල්රුක්ෂි මෙය | ව්‍යාපෘති සහකාර | ඉ.භා.අ. |
| 28 | ආර්. එල්. යූ. රණවක මයා | ව්‍යාපෘති සහකාර | පා.අ. |
| 29 | ඩී.ටී.ආර් ෂෙරීෆා මෙය | ව්‍යාපෘති සහකාර | පුස්ත. |
| 30 | පී.එස් අයේෂා මෙය | ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 31 | එම්.එස්.එස්.ආර් වීරසිංහ මෙය | ව්‍යාපෘති සහකාර | ඉ.භා.අ. |
| 32 | ඩී.එස් මුරගේ මෙය | ව්‍යාපෘති සහකාර | මූ.අ. |
| 33 | කේ.පී.බී.එන් නිර්මාණී මෙය | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 34 | එස්.ආර්.එම්.අයි සඳමාලි මෙය | ව්‍යාපෘති සහකාර | සේ.ක.වැ.අ. |
| 35 | ඩී.වී.ඒ.කේ.එල් සේනාරත්න මෙය | ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 36 | ඒ.එන්.ටී. කේ. අබේගුණවර්ධන මෙය | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 37 | ඩබ්.එස්.එස්. ඉන්ද්‍රසේන මෙය | ව්‍යාපෘති සහකාර | පුස්ත. |
| 38 | කේ.එස්. ලියනවලගේ මෙය | ව්‍යාපෘති සහකාර | පුස්ත. |
| 39 | ඩබ්.පී.සී.පී. වල්පොල මෙය | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |

| | | | |
|---|---|---|---|
| 40 | ඩී.පී.ඒ. දහනායක මයා | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |
| 41 | එම්.එල්.ඩී.එස්. ලියනගේ මෙය | ව්‍යාපෘති සහකාර | වි.අ. |
| 42 | ටී.ඩී.එන්.එස්. ආරියවංශ මෙය | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 43 | ටී.පී.අයි.යූ. පෙරේරා මයා | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 44 | ටී.එච්.පී. මනෝහාරී මෙය | ව්‍යාපෘති සහකාර | ඉ.භා.අ. |
| 45 | ආර්.ඒ.වී.අයි. ආර්. විජේවර්ධන මෙය | ව්‍යාපෘති සහකාර | ශ්‍ර.අ.අ. |
| 46 | සී.වී. රණසිංහ මෙය | ව්‍යාපෘති සහකාර | අ.කා. |
| 47 | ජේ.කේ.වී.එන්. ජයවර්ධන මයා | ව්‍යාපෘති සහකාර | මූ.අ. |
| 48 | ටී.එල්.එච්. මදුසංඛ මයා | ව්‍යාපෘති සහකාර | ව.වැ.අ. |
| 49 | එන්.ඒ.සී.එන්. නිශ්ශංක මෙය | ව්‍යාපෘති සහකාර | මා.ස.ක.වැ.අ. |
| 50 | ආර්. එල්. පී. මදුරංග මයා | කාර්යාල සහායක | මා.ස.ක.වැ.අ. |
| 51 | කේ.ඩී. දයාසිරි මයා | කාර්යාල සහායක | අ.කා. |
| 52 | කේ.එස්.එන් අසෝකා මිය | සනීපාරක්ෂක | පා.අ. |

*පැවරුම් පදනම මත සේවයේ නියුක්ත විශ්‍රාමික සේවකයින්


**පාදක සටහන: පා.අ.**- පාලන අංශය, **වි.අ.**- විභාග අංශය, **මූ.අ.**- මූල්‍ය අංශය, **අ.කා.**- අධ්‍යක්ෂ කාර්යාලය, **පුස්ත.**- පුස්තකාලය, **ශ්‍ර.අ.අ.**- ශ්‍රම අධ්‍යාපන අංශය, **සි.ජා.වි**- සිස්කෝ ජාලකරණ විද්‍යායතනය, **ඉ.භා.අ.**- ඉංග්‍රීසි භාෂා අංශය, **ව.වැ.අ.**- ව්‍යාප්ති වැඩසටහන් අංශය, **ම.තො.ත.ඇ.**- මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණවේදි ඇකඩමිය, **ද.භා.අ.**- දමිළ භාෂා අංශය, **සේ.ක.වැ.අ.**- සේවා කළමනාකරණ වැඩසටහන් අංශය, **මා.ස.ක.වැ.අ.**- මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් අංශය

## 08. පුස්තකාලය

පොත් 23, 000 කින් පමණ යුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පුස්තකාලය ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ විධායක පාඨමාලාව, ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමා පාඨමාලාව සහ සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාවන් හදාරන ශිෂ්‍යයින්ට ඇති වැදගත්ම සම්පතකි.

2015 වසරේදී රු. 997,781.71 ක වියදමින් පුස්තකාලය සඳහා නව පොත් 971 ක් මිලදී ගෙන ඇති අතර තවත් පොත් 05 ක් ආධාර වශයෙන් ලැබී තිබේ. ආයතනය 2015 වසරේදී වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් 64,900/- ක් වැය කළේය.

### 08.1 පුස්තකාලයෙන් සම්පාදනය කරනු ලබන සේවාවන්



### 08.2 පුස්තකාල සාමාජික තොරතුරු

| සාමාජිකත්වය | විස්තරය | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ශිෂ්‍යයින් | ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමාව | 51 |
| | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය I | 197 |
| | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය II | 170 |
| | ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය III | 142 |
| | මානව සම්පත් කළමනාකරණ | 574 |
| | සේවා කළමනාකරණ | 325 |
| ස්ථිර කාර්ය මණ්ඩලය | අධ්‍යයන | 05 |
| | අනධ්‍යයන | 20 |
| | **එකතුව** | **1484** |

### 08.3 2015 වසරේ පුස්තකාලයේ ආදායම

| ආදායම | රුපියල් (රු.) |
|---|---|
| දඩ | 7,214.00 |
| පොත් අස්ථානගතවීම් | 540.00 |
| සාමාජික කාඩ්පත් අස්ථානගතවීම් | 140.00 |
| එකතුව | 7,894.00 |

## 09. ඒකක/ දෙපාර්තමේන්තු

### 09.1 මානව සම්පත් කළමනාකරණ ඒකකය

කළමනාකරණ පාඨමාලා හදාරන සිසුන් සඳහා අධ්‍යයන පහසුකම් ලබා දීමේ අවශ්‍යතාව ඉටු කිරීම උදෙසා ආයතනය විසින් 2007 වසරේදී මෙම මානව සම්පත් කළමනාකරණ ඒකකය පිහිටුවන ලදි. කළමනාකරණ ක්ෂේත්‍රයේ නිරත සිසුන්ට ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීමත් පවතින දැනුම යාවත්කාලීන කිරීම උදෙසාත් අවශ්‍ය වන සේවය සහ අවස්ථාව ලබා දීම මෙම ඒකකය පිහිටුවීමේ මූලික අරමුණ වේ. කළමනාකරණ අංශයන්ගේ සහයෝගිත්වයෙන් කුසලතා සංවර්ධනය කිරීම, නූතන කළමනාකරණ භාවිතයන් පිළිබඳ ශාස්ත්‍රීය අවබෝධය ලබා දීම, පර්යේෂණ හැකියා සංවර්ධනය, කළමනාකරණ ක්ෂේත්‍රයේ පර්යේෂණ අවස්ථාවන් නිර්මාණය කිරීම සහ ආයතනවල සේවයේ නියුක්ත සේවකයන්ගේ හැකියා සංවර්ධනයට විශ්වවිද්‍යාලයීය වපසරිය තුළ පුහුණු වීමට අවකාශ සලසාලීම මෙමගින් සිදු කෙරේ. පසුගිය වසරේ මානව සම්පත් කළමනාකරණ අංශයේ පශ්චාත් උපාධි, විධායක ඩිප්ලෝමා, ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලාවන්හි අධ්‍යයනයේ යෙදුණු සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 501 ක් පමණ විය.

### 09.2 සේවා කළමනාකරණ අංශය

සේවා කළමනාකරණ පාඨමාලා හදාරන සිසුන් සඳහා අධ්‍යයන පහසුකම් ලබා දීමේ අවශ්‍යතාව ඉටු කිරීම උදෙසා ආයතනය විසින් 2007 වසරේදී මෙම සේවා කළමනාකරණ ඒකකය පිහිටුවන ලදි. මෙය ශ්‍රී ලංකාවේ සේවා සහ කර්මාන්ත අංශයන්හි සේවා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ නිපුණතා සහතික නිකුත් කරනු ලබන එකම ආයතනය වේ.

සේවා කළමනාකරණ වැඩසටහන් සහතිකපත්‍ර පාඨමාලාවේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා ගමන් කෙරෙන අධ්‍යයන ගමන් මගකින් යුක්ත වේ. සේවා කළමනාකරණ අංශයේ පාඨමාලාවන්හි අධ්‍යයනයේ යෙදුණු සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 273 ක් පමණ විය.

## 09.3 ව්‍යාප්ති වැඩසටහන් අංශය

මානව සම්පත් අභිවර්ධන ආයතනික දැක්ම සහ මෙහෙවර පවත්වා ගනිමින් වෘත්තියමය විශිෂ්ටත්වය ලබා ගැනිම සඳහා උසස් තත්වයෙන් යුත් ව්‍යාප්ති පාඨමාලාවන් දියත් කිරීම මෙමගින් සිදු කෙරේ. මෙම බොහෝ ව්‍යාප්ති පාඨමාලාවන් වෙනත් ආයතන සමග ඇති කොට ගත් සහයෝගිත්වය පදනම්ව පවත්වාගෙන යනු ලැබේ. ශිෂ්‍යයින්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනිම, මනා පැවැත්ම සහ ආතතියකින් තොරව ගැටලු නිරාකරණය සහ උසස් ඵලදායිත්වයකින් යුත් ජිවිතයක් ගත කිරීමට ඇති හැකියාව වැඩි කිරීමටත් හැකි වන පරිදි පාඨමාලාවන්හි අධ්‍යයන උපකාරක නිර්මාණය කොට ඇත. 2015 වසරේ මෙම අංශයේ පාඨමාලාවන් සඳහා සිසුහු 504 දෙනෙක් ලියාපදිංචි වී සිටියහ.

## 09.4 භාෂා ඒකකය

### 09.4.1 ඉංග්‍රීසි භාෂා අංශය

පැරණි ශ්‍රම අධ්‍යාපන ආයතනයේ ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව ආරම්භ කරන ලද කාලයේම ඉංග්‍රීසි භාෂා පාඨමාලාවද ආරම්භ කරන ලදි. ආයතන පනත වෙනස් වීමෙන් පසුව ද මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව, ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව, පදනම් ඉංග්‍රීසි භාෂා පාඨමාලාව සහ කථන ඉංග්‍රීසි නමින් තව තවත් ඉංග්‍රීසි භාෂා වැඩසටහන සංවර්ධනය කරන ලදි. 2015 වර්ෂය තුළ ඉංග්‍රීසි භාෂා පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී ඇති සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 4391 කි.

### 09.4.2 දමිළ භාෂා අංශය

අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා දැනුම ලබා ගැනිමට අපේක්ෂා කරන ශිෂ්‍යයින් වෙනුවෙන් 2007 වසරේ සිට දමිළ භාෂා පාඨමාලා පවත්වාගෙන යනු ලබන අතර 2010 වසරේ සිට මෙය වෙනම ඒකකයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. මෙම වැඩසටහන මට්ටම් 03 කින් යුක්තය. ඒවා නම්, මූලික, අන්තර්මධ්‍යම හා උසස් වශයෙනි. මෙම වැඩසටහනේ උසස් පාඨමාලාව නිම කරන සිසුහු ඩිප්ලෝමා සහතිකය ලැබීමට සුදුසුකම් ලබති. 2015 වර්ෂය තුළ දමිළ භාෂා පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වී ඇති සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 741 ක් වේ. 2015 වර්ෂයේදි විද්‍යාර්ථීහු 93 ක් දමිළ භාෂා ඩිප්ලෝමාව ලබා ගැනිමට සමත් වූහ.

## 09.5 තොරතුරු තාක්ෂණවේද ඒකකය

### 09.5.1 සිස්කෝ ජාලකරණ විද්‍යායතනය

මානව සම්පත් අභිවර්ධන ආයතනය ඇමරිකා එක්සත් ජනපදයේ සිස්කෝ ජාලකරණ විද්‍යායතනය (CISCO Networking Academy) හා සිස්කෝ සහතිකලත් ජාලකරණ වෘත්තිය පාඨමාලා පවත්වාගෙන යයි. සිස්කෝ ආයතන සහතිකලත් ජාල ආශ්‍රිත මෙහෙයවීම් සහ දත්ත හුවමාරු කිරීමේ මූලික පාඨමාලාව තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ආරම්භක මට්ටමේ රැකියා අවස්ථා හෝ ඊට වඩා වැඩි තොරතුරු සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට බලාපොරොත්තුවන ශිෂ්‍යයන් වෙනුවෙන් නිර්මාණය කොට ඇති අතර සිස්කෝ ආයතන සහතිකලත් ජාල ආශ්‍රිත ආරක්ෂණ පාඨමාලාව මගින් එහි ඉදිරි පියවර සම්පූර්ණ කරනු ලබයි. මෙම ආරක්ෂණ පාඨමාලාව ජාල ආරක්ෂණ වෘත්තිකයන්ගේ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමට ක්‍රියා කරයි.

### 09.5.2 මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණවේද ඇකඩමිය

පරිගණක විද්‍යා විෂය ක්ෂේත්‍රයේ ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් ලබා දීම වෙනුවෙන් 2012 වසරේ සිට මානව සම්පත් අභිවර්ධන ආයතනය මයික්‍රොසොෆ්ට් පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. මෙය මයික්‍රොසොෆ්ට් තොරතුරු තාක්ෂණවේද ඇකඩමිය හා එක්ව පවත්වාගෙන යනු ලබන පාඨමාලාවකි.

මීට අමතරව, තොරතුරු තාක්ෂණවේද ඒකකය මගින් ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතික පත්‍ර පාඨමාලාවක් සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ පාඨමාලාවක් පවත්වන ලදි.

## 10. 2015 වර්ෂය තුළ ආයතනය මුදුන් පමුණුවාගත් අරමුණු

❖ **මානව සම්පත් සංවර්ධනය**

- 2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති පාඨමාලාව, භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව සහ ආපදා කළමනාකරණ හා පාලන විද්‍යාපති පාඨමාලාවන්ගෙන් ආසන්න වශයෙන් පශ්චාත්උපාධිලාභීන් 247 ක් බිහි කරන ලදි.

- එමෙන්ම 2015 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව, සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව, ආපදා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව, ව්‍යාපෘති කළමනාකරණ විධායක ඩිප්ලෝමාව, සංචාරක ව්‍යාපාර සිදුවීම් සහ ආගන්තුක සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය නිෂ්පාදන සහ මාධ්‍ය තාක්ෂණ විධායක ඩිප්ලෝමාව යන විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වන ලද අතර ආසන්න වශයෙන් විධායක ඩිප්ලෝමාධාරීන් 133 ක් බිහි කරන ලදි.

- 2015 වර්ෂය තුළ සේවා කළමනාකරණ ඩිප්ලෝමාව, මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව, උපදේශන මනෝ විද්‍යා ඩිප්ලෝමාව, වෛද්‍ය රසායනාගාර විද්‍යා ඩිප්ලෝමාව, අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව, තොරතුරු තාක්ෂණවේදී කළමනාකරණ ඩිප්ලෝමාව සහ කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලා තුළින් ඩිප්ලෝමාධාරීන් 173 ක් බිහි කිරීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි විය.

- මෙයට අමතරව, ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව, ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව, ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව, කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව, පාසල් හැරයන්නන් සඳහා වූ කෙටි කාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව, පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව, කළමනාකරණ සහතිකපත් පාඨමාලාව, දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික, දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම, ව්‍යාපාරික පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව සහ සී.සී.එන්.ඒ. පාඨමාලාව යන පාඨමාලාවන්ගෙන් බිහි කරන ලද සහතිකපත්‍රලාභීන් සංඛ්‍යාව 4906 කි.

- 2015 වර්ෂයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දුන් අතර ඒ සඳහා සිසුහු 22 ක් ලියාපදිංචි වී සිටියහ.

- 2015 වර්ෂයේ තත්ත්වාරක්ෂණ වැඩපිළිවෙළෙහි එක් අංගයක් ලෙස කොළඹ ගලධාරී හෝටලයේ පැවති වැඩමුළුවට ආයතනයේ සියලු නිලධාරීන්ගේ සහභාගිත්වය ලැබුණු අතර වැඩසටහන සාර්ථක ලෙස නිම කිරීමට හැකියාව ලැබුණි.

❖ **භෞතික පහසුකම් සංවර්ධනය**

- රාජ්‍ය භාණ්ඩාගාර අරමුදල් මත 2015 වසරේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයට නව මෝටර් රථයක් ලැබිණ.

# 11.0 මූල්‍ය ක්‍රියාකාරකම්

**මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය**

**2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

| | 2015 (රු) | 2015 (රු) | 2014 (රු) | 2014 (රු) |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමතුලනයන් | 72,204,336 | | 64,941,137 | |
| වෙළෙඳ සහ සෙසු ලැබීම් | 24,090,478 | | 15,775,110 | |
| පෙර ගෙවීම් | 613,234 | | 17,995 | |
| භාණ්ඩ ලේඛන/ තොග | 1,133,529 | | 1,279,375 | |
| | | 98,041,576 | | 82,013,617 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| සේවක ණය සහ අත්තිකාරම් | 3,670,340 | | 3,976,376 | |
| කෙටි කාලීන තැන්පතු | 217,018,297 | | 143,855,658 | |
| දේපළ පිරියත සහ උපකරණ | 44,284,221 | | 44,769,425 | |
| | | 264,972,858 | | 192,601,459 |
| **මුළු වත්කම්** | | 363,014,434 | | 274,615,076 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| උපචිත ගෙවීම් | 5,745,856 | | 126,402,304 | |
| ඉතුරුම් | 1,698,775 | | 1,156,925 | |
| | | 7,444,631 | | 127,559,229 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| ගෙවිය යුතු වියදම් | 1,405,143 | | 1,352,218 | |
| ඉදිරියට ලද ආදායම | 147,935,205 | | 17,426,850 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 9,416,890 | | 9,827,950 | |
| | | 158,757,238 | | 28,607,018 |
| **මුළු වගකීම්** | | 166,201,869 | | 156,166,247 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 196,812,565 | | 118,448,829 |
| **ශුද්ධ වත්කම් / සම වත්කම්** | | | | |
| වියදම් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 51,372,647 | | 47,070,927 | |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන | 24,152,861 | | 15,668,896 | |
| පරිත්‍යාග | 6,742 | | 6,742 | |
| | | 75,532,250 | | 62,746,565 |
| **සමුච්චිත අරමුදල්** | | | | |
| පොදු සංචිත ගිණුම | 49,176,205 | | 29,164,344 | |
| ආදායම් සහ වියදම් ගිණුම | 12,605,594 | | 11,340,232 | |
| ප්‍රතිතක්සේරු රක්ෂිත | 3,000,000 | | - | |
| | | 64,781,800 | | 40,504,576 |
| **විශේෂිත අරමුදල්** | | | | |
| මා.ස.අ.ආ සංවර්ධන අරමුදල | 56,489,516 | | 11,190,716 | |
| රක්ෂණ යෝජනා ක්‍රමය | - | | 3,997,972 | |
| උත්පාදන අරමුදල | 9,000 | | 9,000 | |
| | | 56,498,516 | | 15,197,688 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම** | | 196,812,565 | | 118,448,829 |

ජේ.එස්.වී.එන්.ටී. සොයිසා මිය
ජ්‍යෙ.ස. මූල්‍යාධිකාරි /ජ්‍යෙ.ස. මූල්‍යාධිකාරි මා.ස.අ.ආ.

මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි
අධ්‍යක්ෂ/ මා.ස.අ.ආ.

## මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

### 2015 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ කාර්ය සාධනය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය

| විස්තරය | 2015 | 2014 |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ ප්‍රතිපාදන පුනරාවර්තන | 31,200,000 | 25,000,000 |
| ක්‍රමක්ෂය රජයේ ප්‍රතිපාදන ක්ෂය වීම | 3,963,826 | 9,296,416 |
| ආදායම - වෙනත් ආදායම | 21,126,390 | 17,086,117 |
| ආදායම -ව්‍යාප්ති වැඩසටහන් | 181,440,095 | 162,515,433 |
| **සමස්ත මෙහෙයුම් ආදායම** | 237,730,311 | 213,897,966 |
| **මෙහෙයුම් වියදම්** | | |
| කාර්යමණ්ඩල වැටුප් | 32,140,937 | 26,042,169 |
| ගමනාගමන වියදම් | 225,167 | 326,724 |
| සැපයුම් | 2,119,349 | 1,228,813 |
| නඩත්තු කාර්යයන් | 1,238,292 | 1,176,058 |
| ගිවිසුම් සේවා | 3,150,265 | 3,861,535 |
| සෙසු මෙහෙයුම් වියදම් | 3,428,474 | 3,032,310 |
| පාරිතෝෂික | 584,267 | 0 |
| ක්ෂය වීම් | 11,954,752 | 10,076,171 |
| ව්‍යාප්ත වැඩසටහන් පිළිබඳ වියදම් | 158,447,477 | 156,813,954 |
| ලියා හැරීම් | 3,975 | |
| **මුළු මෙහෙයුම් වියදම්** | 213,292,956 | 202,557,734 |
| **ශුද්ධ අතිරික්තය/ කාලපරිච්ඡේදය සඳහා (හිඟය)** | **24,437,356** | **11,340,232** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல. / My No. } එච්ආර්ඩී/බී/අයිඑච්ආර්ඒ/ 6/15/02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් [illegible] දින

අධ්‍යක්ෂ,

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතනය නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


Institute of Human Resource Advancement
IHRA
RECEIVED
07 OCT 2016
FINANCE
BRANCH





අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 01

ආයතනය භාවිතයට ගන්නා වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළ යුතු වුවත් කොළඹ විශ්වවිද්‍යාලය විසින් පවරා දී තිබුණු පර්චස් 27.86 ක් වූ ඉඩමේ වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 07

වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් වෙන්කල යුතු වුවත් ප්‍රත්‍යාගණන වත්කම් වල ඵලදායී ජීව කාලය නැවත ඇස්තමේන්තු කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන වටිනාකම රු.3,000,000 ක්වූ වත්කම්හි ජීව කාලය ඇස්තමේන්තු නොකර පැරණි ක්ෂය අනුපාත මත ක්ෂය ගණනය කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාඨමාලා කාලය ගිණුම් වර්ෂයකට වඩා වැඩි පාඨමාලාවන්හි, පාඨමාලා ආදායම් වියදම් හා විලම්භිත ආදායම් ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංග්‍රීසි කතා කිරීමේ සහතික පත්‍ර පාඨමාලා ආදායමෙන් රු. 4,394,087 ක් විවිධ අරමුදල් වෙත මාරු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ දක්වා තිබුණු රු. 11,831,762 ක ලාභ විසර්ජනය ආයතන සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවත් විලම්භිත ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ආයතනයෙහි කෙටිකාලීන පාඨමාලා සඳහා පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමෙහි වූ දීර්ඝ කාලීනව හඳුනා නොගත් රු. 4,096,475 ක තැන්පතු, ආදායම් ප්‍රභවය හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) පාඨමාලා කාලය ගිණුම් වර්ෂයකට වඩා වැඩි පාඨමාලාවන්හි, පාඨමාලා ආදායම් හා වියදම් කාල පදනම මත එක් එක් කාලපරිච්ඡේදයේ ආදායම් ලෙස හඳුනාගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ ආදායම ද ඇතුළුව එකතුව රු. 52,841,001 ක් විලම්භිත ආදායම් ගිණුමකට බැර කර තිබුණි. 2014 වර්ෂය තුළ අවසන් කර තිබු පාඨමාලා 12 ක ආදායම රු.3,729,821 ක් හා සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු පාඨමාලා 18 කට අදාල ආදායම රු.20,387,455 ක් පිළිවෙලින් සමුච්චිත ආදායමට හා සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව විලම්භිත ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඉ) අන්තර් පාඨමාලා වෙනුවෙන් දරන ලද රු. 348,513 ක වියදම් එම ගිණුම් අතර සටහන් කිරීම වෙනුවට උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඊ) ක්‍රමක්ෂය ගණනය කිරීමේදී වත්කම් සඳහා අරමුදල් ලැබී තිබු මූලාශ්‍රය හඳුනාගෙන වාර්ෂික ක්ෂය පදනම් කරගෙන ක්‍රමක්ෂය ගණනය කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසුව මිලදී ගත් වත්කම් සඳහා පමණක් ක්‍රමක්ෂය ගණනය කර තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 | (i) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 62 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් 06 දෙනෙකු වෙත එකතුව රු.4,557,244 ක අත්තිකාරම් ලබාදී තිබුණි.<br><br>(ii) ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 35ක දී ලබාගෙන තිබූ එකතුව රු. 3,941,315 ක අත්තිකාරම් සඳහා දින 30 සිට දින 275 දක්වා කාලයක් ගතවී තිබුණ ද නිරවුල් කර නොතිබුණි.<br><br>(iii) ලබාගත් අත්තිකාරමක් පියවන තෙක් තවත් අත්තිකාරමක් ලබා නොදිය යුතු වුවත් ලබාගත් අත්තිකාරම් නොපියවූ නිලධාරීන් තිදෙනෙකු වෙත අවස්ථා 12 කදී නැවත අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු. 100,000ක් වුවත් ආයතනය විසින් අවස්ථා 52 කදී රු.105,000 සිට රු.842,265 දක්වා පරාසයක් තුළ එකතුව රු. 26,211,702 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඇ) | 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාරවල මුදල් ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත්, ආයතනය විසින් රු.69,500,000 ක් වටිනා ආයෝජන සම්බන්ධයෙන් එසේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 13 දිනැති අංක 49 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ **XX** පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිළධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිළධාරීන් 05 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු. 7,903,304 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පාඨමාලා ආදායමින් සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. 6,195,480 ක් ආයතනයේ සේවකයින් 24 දෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කර ඇති වැටුප් හා දීමනා වලට පරිබාහිරව මුදල් අමාත්‍යාංශ අනුමැතියකින් තොරව ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් 12 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 2,589,272 ක දීමනා ගෙවා තිබුණි.

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබූ පාඨමාලා 03 කට අදාලව සාමාන්‍ය රාජකාරී වේලාව තුළ පවත්වා තිබූ විභාග රාජකාරී සඳහා සහභාගී වූ සේවකයින් සඳහා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු. 689,750 ක දීමනා ගෙවා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ තුළින් ප්‍රවාහන පහසුකම් හිමිකම ලබාදී නොමැති මාණ්ඩලික නිලධාරීන් 06 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 1,064,250ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, රු. 24,437,356 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 11,340,232 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 13,097,124 කින් වර්ධනය වීම සඳහා කෙටිකාලීන පාඨමාලා ආදායම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ආයතනයේ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයේදී සුළු අඩුවීමක් පෙන්නුම් කළද නැවත 2015 වර්ෂයේදී එය සියයට 115 කින් වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2014 හා 2015 වර්ෂවල ආයතනයේ දායකත්වය පිළිවෙලින් රු. 47,458,572 ක් හා රු. 68,533,045 ක් ලෙස පෙන්නුම් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දායකත්වයේ වැඩි වීම සියයට 44 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 13.2:1 ක් හා 13:1 ක් වූ අතර ජංගම වත්කම් තුළ සියයට 72.6 ක් මුදල් හා මුදල් වලට සමාන දෑ නියෝජනය වේ. සමාලෝචිත වර්ෂය තුළ රු. 72,204,336 ක මුදල් ශේෂ පවත්වාගෙන යාම ද්‍රවශීලතා අනුපාත ඉහළ යාමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

ආයතන නියමාවලියේ 6 ඡේදයෙහි (අ) හා (ආ) වගන්ති පරිදි නව පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව "Transportation & logistics Management" ඩිප්ලෝමා නමින් එක් අවුරුදු පාඨමාලාවක් ආරම්භ කර ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් බඳවා ගෙන තිබුණි. මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් පළමු ශිෂ්‍ය කණ්ඩායමෙහි විභාග ප්‍රතිඵල ලබාදීම ප්‍රමාද කර තිබූ අතර දෙවන ශිෂ්‍ය කණ්ඩායමෙන් ලබාගත් මුදල් නැවත ගෙවා තිබුණි. මේ අනුව නියමාවලිය අභිබවා කටයුතු කිරීම තුළ ආයතනය විසින් දරන ලද රු. 202,250 ක ප්‍රචාරණ හා සම්මුඛ පරීක්ෂණ වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රම අධ්‍යයනවේදී උපාධි පාඨමාලාව සඳහා ප්‍රතිපාදන නොතිබියදී පාඨමාලාවේ විෂයයන් දෙකකට අදාල ඉදිරිපත්කිරීම් (presentation) සඳහා ආයතනයේ දේශන ශාලා භාවිතා නොකර හෝටලයක් භාවිතා කිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාඨමාලා ආදායම්වලින් රු 1,108,450 ක් වැය කර තිබුණි.

(ආ) ආයතනය විසින් ක්‍රියාත්මක පාඨමාලාවන්හි සම්බන්ධීකාරකවරුන් වෙත රු.80,000 දක්වා වූ ඉහල සම්බන්ධීකරණ දීමනාවක් ගෙවා තිබූ අතර පාඨමාලාවෙහි එක් එක් ශිෂ්‍ය කණ්ඩායම සඳහා වෙන වෙනම සම්බන්ධීකරණ දීමනා ලබමින් එකම ආචාර්යවරයා පාඨමාලා කිහිපයක සම්බන්ධීකාරක දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු සම්බන්ධීකරණ දීමනා වියදම වූ රු. 3,500,000 න් රු. 3,000,000 ක දීමනා ආචාර්යවරුන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබුණි.

(ඇ) සමාසික තුනකින් සමන්විත " MSc in Disaster Analysis & Management Mitigation No 01 " පාඨමාලාවේ අවසන් සමාසික පරීක්ෂණය දක්වා සම්පූර්ණ පාඨමාලා ගාස්තුව නොගෙවූ ශිෂ්‍යයන් 25 දෙනෙකුගේ එකතුව රු. 1,325,000 ක හා එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලා 04 ක ලියාපදිංචි ශිෂ්‍යයන් 30 දෙනෙකුගේ එකතුව රු.525,000 ක පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසන් සමාසික පරීක්ෂණයට හා අසමත් පරීක්ෂණයන්ට නැවත පෙනී සිටීමට ද අවස්ථාව ලබා දී තිබුණි. අවසන් සමාසික පරීක්ෂණය පවත්වා වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමට ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා ප්‍රවර්ධනය සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු. 2,670,013 ක් වැයකර තිබුණ ද ප්‍රධාන පුවත්පත් ප්‍රකාශන ආයතන සමඟ සම්බන්ධ නොවී නියෝජිත ආයතනයක් වෙතින් දැන්වීම් පල කරවා ගෙන තිබුණි.

(ඉ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 14 දෙනෙකු රු. 40,816 ක් වටිනා පොත් 65 ක් බාහිරට රැගෙන ගොස් අවුරුදු 01 සිට අවුරුදු 10 දක්වා ගතවී ඇතත් නැවත භාරදී නොතිබුණි. මෙම පොත් 65 න් පොත් 28 ක්ම එක් ආචාර්යවරයකු විසින් රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර එම පොත් සම්බන්ධයෙන් ආයතනය පසු විපරම් කර නොතිබුණි.

(ඊ) ආයතනය තුළ භාවිතා කරන මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සේවා ගිවිසුම් සඳහාවූ ආයතන 9ක් වෙත රු.155,771ක් ගෙවා තිබුණද වර්ෂය තුළ සේවාවන් සිදු කරගත් බවට කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(උ) නිසිලෙස පූරෝකථනය කළ වැය ඇස්තමේන්තු නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී රු.180,399 ක වියදම් වෙනුවෙන් අවස්ථා 12 කදී එකතුව රු.689,500 ක අත්තිකාරම් ලබාදී තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

4.3 අරමුදල් ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ සැලකිය යුතු ප්‍රමාණයක මුදල් ශේෂයක් අඛණ්ඩව පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූයෙන් එම මුදල් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 10,000,000 ක් ලැබී තිබුණු නමුත් වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන රු. 1,516,035 ක් වූයෙන් වර්ෂය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.8,483,965 ක් ඉතිරිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ සමුච්චිත ශේෂය රු. 24,152,861 ක් වූයෙන් රජයේ මුදල් ඵලදායී ලෙස යෙදවීමෙන් තොරව හා අඛණ්ඩව ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) දීර්ඝ කාලයක සිට ගබඩාවේ වහල අබලන් වී ගබඩාව තුලට ජලය කාන්දු වෙමින් පැවතීම හේතුවෙන් ගබඩාවෙන් කොටසක් අතහැර දමා තිබුණි. වියන්ගෙන් ද ගබඩාවට සැලකිය යුතු හානියක් සිදුවී තිබු නමුත් පිළිසකර කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු

කොන්ත්‍රාත් පදනම මත සේවයකළ නිලධාරියකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් කම්කරු කොමසාරිස්වරයාගේ නියෝගයට අනුව සේවකයාගේ දායකය වූ රු.243,199 ක් හා නියමිත දිනයන්හිදී දායක මුදල් නොගෙවීම නිසා අධිභාර ලෙස රු. 364,797ක් ද සමඟ එකතුව රු. 607,996 ක් ගෙවීමට සිදුවී තිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පාලනය | | ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීම් කටයුතු සිදු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල නොකිරීම, වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ඇ) | තොග පාලනය | | භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබීම. |
| (ඈ) | මූල්‍ය පාලනය | (i) | සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීම. |
| | | (ii) | සුළු මුදල් සීමාව පිළිනොපැදීම, රිසිට් පොත් පාලනයකින් තොරව මුදල් අයකැමි වෙත ලබාදී තිබීම, භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මුදල් ආයෝජනය කර තිබීම, අනුමැතියකින් තොරව පාඨමාලා ආදායම දීමනා ලෙස සේවකයන්ට ලබාදී තිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| | මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 2<br>2.1 | මූල්‍ය ප්‍රකාශන<br>තත්වාගණනය කළ මතය | මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | එකඟ වේ. | |
| 2.2<br><br>2.2.1 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br><br>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 01 | ආයතනය භාවිතයට ගන්නා වත්කම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළ යුතු වුවත් කොළඹ විශ්වවිද්‍යාලය විසින් පවරා දී තිබුණු පර්චස් 27.86 ක් වූ ඉඩමේ වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවලින් ඉදිරිපත් කිරීම සඳහා අදාළ තොරතුරු රැස් කරමින් පවතී. | තොරතුරු රැස් කරමින් පවතී. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 07 | වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීව කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් වෙන්කළ යුතු වුවත් ප්‍රත්‍යාගණන වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත ඇස්තමේන්තු කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන වටිනාකම රු. 3,000,000 ක්වූ වත්කම්හි ජීව කාලය ඇස්තමේන්තු නොකර පැරණි ක්ෂය අනුපාත මත ක්ෂය ගණනය කර තිබුණි. | 2016 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 වර්ෂයේදී අදාළ වත්කම්වල ඵලදායි ජීවිත කාලය ගණනය කර මූල්‍ය ප්‍රකාශවල හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත. |
| 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති | පාඨමාලා කාලය ගිණුම් වර්ෂයකට වඩා වැඩි පාඨමාලාවන්හි, පාඨමාලා ආදායම් වියදම් හා විලම්බිත ආදායම් ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි. | | ගිණුම්කරණ ප්‍රතිපත්ති 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කොට ඇත. |
| 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | (අ) ඉංග්‍රිසි කතා කිරීමේ සහතික පත්‍ර පාඨමාලා අදායමෙන් රු. 4,394,087 ක් විවිධ අරමුදල් වෙත මාරු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2016 වර්ෂයේ සිට මෙම මාරු කිරීම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි කොට ඇත. |
| | (ආ) හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ දක්වා තිබුණු රු.11,831,762 ක ලාභ විසර්ජනය ආයතන සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවත් විලම්බිත අදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2016 වර්ෂයේ සිට මෙය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 වර්ෂයේ නිවැරදි කර ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| | (ඇ) | ආයතනයෙහි කෙටිකාලීන පාඨමාලා සඳහා පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමෙහි වූ දීර්ඝ කාලීනව හඳුනා නොගත් රු. 4,096,475 ක තැන්පතු, ආදායම් ප්‍රභවය හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මෙයින් මිලියනයක ප්‍රමාණයක් දැනටමත් ආදායම් ප්‍රභව හඳුනාගෙන නිවැරදි කර ඇත. | |
| | (ඈ) | පාඨමාලා කාලය ගිණුම් වර්ෂයකට වඩා වැඩි පාඨමාලාවන්හි, පාඨමාලා ආදායම් හා වියදම් කාල පදනම මත එක් එක් කාලපරිච්ඡේදයේ ආදායම් ලෙස හඳුනා ගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ අදායම ද ඇතුළුව එකතුව රු. 52,841,001 ක් විලම්බිත ආදායම් ගිණුමකට බැර කර තිබුණි. 2014 වර්ෂය තුළ අවසන් කර තිබූ පාඨමාලා 12 ක ආදායම රු. 3,729,821 ක් හා සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර තිබුණු පාඨමාලා 18 කට අදාළ ආදායම රු. 20,387,455 ක් පිළිවෙලින් සමුච්චිත ආදායමට හා සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව විලම්බිත ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | 2016 වර්ෂයේ සිට නිවැරදිව විලම්බිත ආදායම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| | (ඉ) අන්තර් පාඨමාලා වෙනුවෙන් දරන ලද රු. 348,513 ක වියදම් එම ගිණුම් අතර සටහන් කිරීම වෙනුවට උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2016 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2016 වර්ෂයේ නිවැරදි කර ඇත. |
| | (ඊ) ක්‍රමක්ෂය ගණනය කිරීමේදි වත්කම් සඳහා අරමුදල් ලැබී තිබූ මූලාශ්‍රය හඳුනාගෙන වාර්ෂික ක්ෂය පදනම් කරගෙන ක්‍රමක්ෂය ගණනය කළ යුතු වුවත් 2011 වර්ෂයෙන් පසුව මිලදී ගත් වත්කම් සඳහා පමණක් ක්‍රමක්ෂය ගණනය කර තිබුණි. | 2016 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති. | |
| 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම. | | | |
| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට යොමුව | පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි | | | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|---|
| | (i) | මුදල් රෙගුලාසි 371 | (i) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 62 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් 06 දෙනෙකු වෙත එකතුව රු. 4,557,244 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව අත්තිකාරම් ලබා දිම මාණ්ඩලික නිලධාරීන්ට සීමා විය යුතු වුවත් ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා ප්‍රමාණය අනුව ආයතනයේ සිටින මාණ්ඩලික නිලධාරීන් හතරදෙනාට පමණක් අත්තිකාරම් ලබා දිය නොහැකි නිසා මෙසේ මාණ්ඩලික නොවන නිලධාරීන්ටද, අත්තිකාරම් ලබා දෙනු ලැබේ. ඒ සඳහා ශාස්ත්‍රීය කමිටු අනුමැතිය ලබා ගෙන ඇත. | මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් ලබා දිම අවම කොට ඇති අතර ලබා දෙනු ලබන අත්තිකාරම් මුදල් ප්‍රමාණයේ සීමාවද, අඩු කිරීමට පියවර ගෙන ඇත. |
| | | | (ii) | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී අවස්ථා 35 ක දී ලබාගෙන තිබූ එකතුව රු. 3,941,315 ක අත්තිකාරම් සඳහා දින 30 සිට දින 275 දක්වා කාලයක් ගතවී තිබුණ ද නිරවුල් කර නොතිබුණි. | ලබාගත් අත්තිකාරම්වල ඉතිරි මුදල් නිසි පරිදි ගෙවා ඇති නමුත් බිල්පත් නිසි වේලාවට නොලැබීම, එහි පවතින අඩුපාඩු තිබීම නිසා නැවත සකස් කිරීමට සිදුවන බැවින් බොහෝ අත්තිකාරම් පියවීමට කල් ගත වී තිබේ. වර්තමානයේ ලබා ගත් අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කර ඇත. | ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම නියමිත කාලය තුළදී ම සිදු කෙරේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| | (iii) ලබාගත් අත්තිකාරම් පියවන තෙක් තවත් අත්තිකාරමක් ලබා නොදිය යුතු වුවත් ලබාගත් අත්තිකාරම් නොපියවූ නිලධාරීන් තිදෙනෙකු වෙත අවස්ථා 12 කදී නැවත අත්තිකාරම් ලබා දී තිබුණි. | අත්තිකාරම් ලබා දිය හැකි ස්ථිර කාර්ය මණ්ඩල සේවකයන් සංඛ්‍යාව පවත්නා පාඨමාලා ප්‍රමාණය හා සසඳන කළ ප්‍රමාණවත් නොවන බැවින් එකම පුද්ගලයා විවිධ පාඨමාලා රැසක් ආවරණය කළ යුතු නිසා මෙසේ එකම ස්ථිර සේවකයාට විවිධ පාඨමාලාවන් යටතේ අත්තිකාරම් ලබා දීමට සිදු වී ඇත. එසේම අත්තිකාරම් ලබා ගත් පුද්ගලයන් විශ්වාස කඩකිරීමකින් තොරව අත්තිකාරම් පියවා ඇති නිසාත් ආයතනයේ සිටින සීමිත කාර්ය මණ්ඩලය මගින් පාඨමාලාවන් සාර්ථකව පවත්වා ගැනීම සඳහාත් මෙසේ එකම පුද්ගලයන්හට අත්තිකාරම් ලබා දීමට සිදු වී තිබේ. | ආයතනයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කර ඇත.<br><br>ආයතන කාර්යක්ෂමතාව පවත්වා ගැනීමට හැකි වන පරිදි පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංඛ්‍යාව අඩු කොට ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2016 වර්ෂය අවසන් වන විට අවසන් කිරීමට කටයුතු යොදා ඇත. | |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු. 100,000 ක් වුවත් ආයතනය විසින් අවස්ථා 52 කදී රු. 105,000 සිට රු. 842,265 දක්වා පරාසයක් තුළ එකතුව රු. 26,211,702 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | අත්තිකාරම් ලබා දීමේදී රු. 100, 000 කට වඩා මුදල් අත්තිකාරම් ලබා නොදීමට 2015 වසර මැදදී තීරණය කිරීමෙන් පසු එම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා නොදුන් අතර, එම සීමාව ඉක්මවා ඇත්තේ වසර මුල ලබා දුන් අත්තිකාරම් සහ වෙක්පත් අත්තිකාරම්ය. වර්තමානය වන විට රු. 100,000 ඉක්මවා මුදල් අත්තිකාරම් දෙනු නොලැබේ. | වර්තමානය වනවිට කිසිදු නිලධාරියෙකුට රු. 100,000 කට වඩා මුදලක් අත්තිකාරම් වශයෙන් නොදෙනු ලැබේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | (ඈ) | 2004 ජුලි 29 දිනැති අංක පිඑඩි/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යාපාරවල මුදල් ආයෝජනය සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත්, ආයතනය විසින් රු. 69,500,000 ක් වටිනා ආයෝජන සම්බන්ධයෙන් එසේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | අනුමැතිය ඉල්ලා භාණ්ඩාගාරය වෙත ලිපි යවා ඇත. | |
| | (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 13 දිනැති අංක 49 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මේ දිනවල ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම සිදු කරමින් පවතී. | වර්තමානයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇති අතර එහි වැඩ කටයුතු 75% ක් පමණ අවසන් කොට ඇත. |
| | (ඉ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිලධාරීන් 05 දෙනෙකුගේ පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව වැටුප් හා දීමනා ලෙස රු. 7,903,304 ක් ගෙවීම් කර තිබුණි. | ඇඟිලි සටහන් යන්ත්‍රයෙහි පැමිණීමට සහ පිටවීම සටහන් කරන ලෙස සියලුම කාර්ය මණ්ඩලය වෙත උපදෙස් ලබා දී තිබේ. | |
| | (ඊ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පුස්තකාල පොත් සමීක්ෂණය මේ වන විට සිදු කර ඇත. | |

| මූලය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| 2.4 | ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවු ගනුදෙනු | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | | |
| | | (අ) | ආයතනයේ පාඨමාලා ආදායමින් සමාලෝචිත වර්ෂය තුළ දී එකතුව රු. 6,195,480 ක් ආයතනයේ සේවකයින් 24 දෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම දීමනා ගෙවනු ලබන්නේ පවත්වාගෙන යනු ලබන බාහිර පාඨමාලාවලින් උපයන අරමුදල් මගින් ආයතනයේ සේවකයන්ට එම පාඨමාලාවන්ට දක්වන දායකත්වය සඳහාය. ආයතනයේ ප්‍රධාන පාඨමාලාව වන රජයේ අරමුදල් මගින් නඩත්තුවන ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ කටයුතුවලට අමතරව මුදල් අයකර පවත්වා ගෙන යනු ලබන බාහිර පාඨමාලා විශාල ප්‍රමාණයක් ආවරණය කිරීමේදි එම කටයුතු සඳහා සෘජුවම දායකත්වය සපයන ආයතනයේ කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම සඳහා වර්තමානයේ චක්‍රලේඛ අංක 2016/01 යටතේ අවස්ථාව ලැබී ඇත. | අංක 2016/01 චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කර ඇති වැටුප් හා දීමනාවලට පරිබාහිරව මුදල් අමාත්‍යාංශ අනුමැතියකින් තොරව ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අචාර්යවරුන් 12 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු. 2,589,272 ක දීමනා ගෙවා තිබුණි. | මෑතක් වනතුරුම පාඨමාලාවල ගෙවීම් සම්බන්ධයෙන් නිශ්චිත චක්‍රලේඛයක් මහා භාණ්ඩාගාරය විසින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් නිකුත් කර නොමැති අතර ශාස්ත්‍රීය සභාව විසින් අනුමත කරන ලද අදාළ පාඨමාලාවල අය - වැය පාදක කර මෙම ගෙවීම් කර ඇත. කෙසේ නමුත් 2015 වසරේදී ආයතනයට පත්වූ වර්තමාන අධ්‍යක්ෂවරයා විසින් නව අය - වැය මාර්ගෝපදේශයක් (New Budget Guideline) සකස් කර එය පදනම් කර අලුතින් පටන් ගත් පාඨමාලාවල අය - වැය සකස් කර ඇත. එය මගින් කාර්ය මණ්ඩල ගෙවීම් 80% කින් පමණ අවම වී ඇත. එම නිසා ඉදිරියේදී මෙම ගෙවීම් තව දුරටත් ඔබ අපේක්ෂා කරන පරිදි අඩු වනු ඇත. තවද වර්තමානය වන විට චක්‍රලේඛ අංක 2016/01 යටතේ ගෙවීම් කිරීමට අවස්ථාව ලැබේ. | අංක 2016/01 චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. |
| | | (ඇ) | ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබූ පාඨමාලා 03 කට අදාළව සාමාන්‍ය රාජකාරි වේලාව තුළ පවත්වා තිබූ විභාග රාජකාරි සඳහා සහභාගි වූ සේවකයින් සඳහා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු. 689,750 ක දීමනා ගෙවා තිබුණි. | වර්තමානය වන විට මෙම ගෙවීම් නවත්වා ඇත. | |

| | මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දි ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ තුළින් ප්‍රවාහන පහසුකම් හිමිකම ලබාදි නොමැති මාණ්ඩලික නිලධාරින් 06 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 1, 064, 250 ක ප්‍රවාහන දිමනා ගෙවා තිබුණි. | වර්තමානය වන විට මෙම ගෙවීම් නවත්වා ඇත. | |
| 3<br>3.1 | මූල්‍ය සමාලෝචනය<br>මූල්‍ය ප්‍රතිඵල | | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, රු. 24,437,356 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 11,340,232 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 13,097,124 කින් වර්ධනය වීම සඳහා කෙටිකාලින පාඨමාලා අදායම් ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.<br>සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දි 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ආයතනයේ අතිරික්තය අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයේ දි සුළු අඩුවීමක් පෙන්නුම් කළද, නැවත 2015 වර්ෂයේ දි එය සියයට 115 කින් වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු 2014 හා 2015 වර්ෂවල ආයතනයේ දායකත්වය පිළිවෙළින් රු. 47,458,572 ක් හා රු. 68,533,045 ක් ලෙස පෙන්නුම් කර තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දි වැඩි වීම සියයට 44 ක් විය. | එකඟ වේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| 3.2 | විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය | ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 13.2:1 ක් හා 13:1 ක් වූ අතර ජංගම වත්කම් තුළ සියයට 72.6 ක් මුදල් හා මුදල්වලට සමාන දෑ නියෝජනය වේ. සමාලෝචිත වර්ෂය තුළ රු. 72,204,336 ක මුදල් ශේෂ පවත්වාගෙන යාම ද්‍රවශීලතා අනුපාත ඉහළ යාමට හේතු වී තිබුණි. | එකඟ වේ. | |
| 4<br>4.1 | මෙහෙයුම් සමාලෝචනය<br>කළමනාකරණ ක්‍රියාකාරකම් | ආයතන නියමාවලියේ 6 ඡේදයෙහි (අ) හා (ආ) වගන්ති පරිදි නව පාඨමාලාවන් ආරම්භ කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව "Transportation & Logistics Management" ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් බඳවා ගෙන තිබුණි. මෙම පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් පළමු ශිෂ්‍ය කණ්ඩායමෙහි විභාග ප්‍රතිඵල ලබා දීම ප්‍රමාද කර තිබූ අතර දෙවන ශිෂ්‍ය කණ්ඩායමෙන් ලබාගත් මුදල් නැවත ගෙවා තිබුණි. මේ අනුව නියමාවලිය අභිබවා කටයුතු කිරීම තුළ ආයතනය විසින් දරන ලද රු. 202,250 ක ප්‍රචාරණ හා සම්මුඛ පරීක්ෂණ වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | වර්තමානයේ නව පාඨමාලාවන් අනුමැතියකින් තොරව ආරම්භ නොකරනු ලැබේ. | |

| | මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| 4.2 | මෙහෙයුම් අකාර්යක්ෂමතා | | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | | (අ) | ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව සඳහා ප්‍රතිපාදන නොතිබියදි පාඨමාලාවේ විෂයයන් දෙකකට අදාළ ඉදිරිපත් කිරීම් (presentation) සඳහා ආයතනයේ දේශන ශාලා භාවිත නොකර හෝටලයක් භාවිත කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි වෙනත් පාඨමාලා අදායම්වලින් රු. 1,108,450 ක් වැය කර තිබුණි. | ශාස්ත්‍රිය කමිටුවේ තිරණයකට අනුව වර්තමානයේ සියලුම පාඨමාලාවලින් 2% ක ප්‍රමාණයක් ශ්‍රම අධ්‍යාපනවේදි පාඨමාලාව සඳහා වෙන් කිරීමට තිරණය කර ඇත. ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන්නේ සිසුන්ගෙන් ගාස්තු අය කිරීමෙන් තොරව රජයේ ප්‍රතිපාදන මතයි. එනිසා එම පාඨමාලාවල පුහුණු හා සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් වෙනත් මුදල් අය කරන පාඨමාලාවල අතිරික්ත මුදල් භාවිත කර ඇත. ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවට සහභාගි වන ශිෂ්‍යයෝ රාජ්‍ය සහ පුද්ගලික අංශවල සේවකයින් වෙති. ඒ නිසා මෙම පාඨමාලාවේ දේශන පවත්වන්නේ සතියේ දිනවල ප.ව. 5.00 සිට 7.30 දක්වාය. එම නිසා ඉදිරිපත් කිරීම් හා පුහුණු කටයුතු සතිඅන්තවල යොදා ගැනිමට සිදුවේ.<br><br>දැනට මානව සම්පත් අභිවර්ධන ආයතනය සතුව ඇත්තේ එක් කුඩා දේශන ශාලාවක් පමණි. ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ දේශන පවත්වාගෙන යන්නේ අධ්‍යාපන පිඨය තුළයි. සතිඅන්තයේ එහි පාඨමාලා රාශියක් අධ්‍යාපන පිඨය විසින් පවත්වන බැවින් ඉඩකඩ ලබාගැනිමට නොහැකි වී ඇත. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
| --- | --- | --- | --- |
| | | ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි I පාඨමාලාවේ ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් ස්ථාන 9 කදිත් උපාධි III පාඨමාලාවේ ඉදිරිපත් කිරීම් ස්ථාන 6 ක දිත් සිදු කරන ලදි. එවැනි ස්ථාන සංඛ්‍යාවක් සති අන්තයේ විශ්වවිද්‍යාලය තුළ සකසා ගැනිම අපහසුය.<br><br>ඉහත වැඩසටහන්වලදි ඉදිරිපත් කිරීම්වලට අමතරව ආරම්භක දේශන, හැඳින්වීමේ කථා වැනි ශිෂ්‍යයින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයට අවශ්‍ය අංග ඇතුළත් වී තිබුණි. ඉදිරිපත් කිරීම් ඇගයීමට දේශකවරුන් රාශියක් යොදා ගැනිමට සිදුවේ. ඔවුන්ගෙන් වැඩි දෙනෙකුගේ සේවය ලබාගත හැක්කේ සති අන්තයට පමණි. එමෙන්ම ඉදිරිපත් කිරීමේ කටයුතු දිගු වේලාවක් පැවැත්වෙන බැවින් ඔවුනට නිසි පහසුකම් සැලසීමට අත්‍යවශ්‍ය වේ. ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලා සඳහා සම්බන්ධ වන්නේ රැකියාවල නියුතු වැඩිහිටි සිසුන්ය. රැකියාව, පෞද්ගලික ජිවිතය වැනි අංශවල ද කාර්යබහුලතාවකින් ඔවුහු පසුවෙති. ඒ නිසා විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු වශයෙන් ගතකළ හැකි කාලය ඉතා සීමිතය. කණ්ඩායම් කුසලතා සංවර්ධනය, සන්නිවේදන කුසලතා සංවර්ධනය, නායකත්ව කුසලතා සංවර්ධනය, වැනි අත්‍යවශ්‍ය කුසලතා රැසක් වැඩිදියුණු කිරීම ඉහත වැඩසටහන්වල අරමුණු වු අතර වර්තමානයේ දි එම කුසලතා උපාධිධාරීන්ගේ ගුණත්ව ලක්ෂණ ලෙස පිළිගෙන ඇත. එබැවින් එම කුසලතා සංවර්ධනය උදෙසා එදිනෙදා හුරුපුරුදු පරිසරයකින් මිදි වෙනමම පරිසරයක් ඒ සඳහා යොදා ගැනිම යෝග්‍ය වන බව විශ්වවිද්‍යාල අධ්‍යයන සාමාජිකයින්ගේ පිළිගැනිම වේ. ඉහත තත්වයන් මත පුහුණු පාඨමාලාවන් හෝටලයකදි පවත්වන්නට යෙදි ඇත.<br><br>තවද, මෙම වියදම දරා ඇත්තේ සහභාගි වු සම්පත් දායකයින්ට ගෙවීම් කිරීම, අනෙකුත් කාර්ය මණ්ල ගෙවීම් සහ සමස්ත කර්තව්‍ය වෙනුවෙන් සිදු කළ ගෙවීම් වෙනුවෙනි. | |

| | මුල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (ආ) | ආයතනය විසින් ක්‍රියාත්මක පාඨමාලාවන්හි සම්බන්ධීකාරකවරුන් වෙත රු. 80,000 දක්වා වූ ඉහළ සම්බන්ධීකරණ දීමනාවක් ගෙවා තිබූ අතර පාඨමාලාවෙහි එක් එක් ශිෂ්‍ය කණ්ඩායම සඳහා වෙන වෙනම සම්බන්ධීකරණ දීමනා ලබමින් එකම අචාර්යවරයා පාඨමාලා කිහිපයක සම්බන්ධීකරණ දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු සම්බන්ධීකරණ දීමනා වියදම වූ රු. 3,500,000 න් රු. 3,000,000 ක දීමනා අචාර්යවරුන් දෙදෙනෙකු විසින් ලබාගෙන තිබුණි. | ආයතන අභ්‍යන්තරයේ සකසන ලද නව අය - වැය මාර්ගෝපදේශය (New Budget Guideline) මගින් සියලුම ගෙවීම් පිළිබඳව එකඟතාවකට පැමිණ ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නව චක්‍රලේඛය අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. Batch I සහ Batch II වෙන වෙනම පවත්වාගෙන යනු ලැබේ. සියලුම කටයුතු වෙන වෙනම ඉටු කිරීමට සිදුවේ. වර්තමානය වන විට Batch I සහ Batch II යනුවෙන් සම්බන්ධීකරණ දීමනා ගෙවීම් කිරීම නතර කර ඇත. තවද ඉදිරියේදී ආයතනයට නව කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට පියවර ගෙන ඇති අතර එවිට මෙම කථිකාචාර්යවරුන් සම්බන්ධීකරණය කරන පාඨමාලාවන් සංඛ්‍යාව අඩුවේ. | වර්තමානයේදී එක් පාඨමාලාවක එක් එක් ශිෂ්‍ය කණ්ඩායම් වෙනුවෙන් වෙන් වෙන්ව සම්බන්ධීකරණ ගාස්තු ගෙවීම් සම්පූර්ණයෙන්ම නතර කොට ඇති අතර එක් පාඨමාලාවක් වෙනුවෙන් ගෙවන උපරිම සම්බන්ධීකරණ දීමනාව රු. 25,000 දක්වා අඩු කොට ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (ඇ) | සමාසික තුනකින් සමන්විත "MSc in Disaster Analysis & Management Mitigation No 01" පාඨමාලාවේ අවසන් සමාසික පරීක්ෂණය දක්වා සම්පූර්ණ පාඨමාලා ගාස්තුව නොගෙවූ ශිෂ්‍යයන් 25 දෙනෙකුගේ එකතුව රු.1,325,000 ක හා එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලා 04 ක ලියාපදිංචි ශිෂ්‍යයන් 30 දෙනෙකුගේ එකතුව රු. 525,000 ක පාඨමාලා ගාස්තු අයකර ගැනීමකින් තොරව අවසන් සමාසික පරීක්ෂණයට හා අසමත් පරීක්ෂණයන්ට නැවත පෙනී සිටීමට ද අවස්ථාව ලබා දී තිබුණි. අවසන් සමාසික පරීක්ෂණය පවත්වා වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් හිඟ පාඨමාලා ගාස්තු අයකර ගැනීමට ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ශිෂ්‍යයන් බොහෝ දෙනෙකු සම්පූර්ණ මුදලම ආයතනය වෙත මේ වන විට ගෙවා ඇත. ඉතිරි පිරිසෙන් කිහිප දෙනෙකු රට හැර ගොස් සිටින අතර ඔවුන් පාඨමාලාව සම්පූර්ණ කර නැත. අනෙක් අයට විනය ක්‍රියා මාර්ගයක් පවතින නිසා එහි තීරණය ලැබුණු පසු මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම පාඨමාලා සති අන්තයේ ක්‍රියාත්මක වූ බැවින් මුදල් අයකර ගැනීමේදී අපහසුතා ඇති වූ අතර වර්තමානයේ දී සියලු පාඨමාලා ආරම්භයේදීම මුදල් අයකර ගැනීමට කළමනාකාරිත්වය තීරණය කර ඇති නිසා ඉදිරියේදී මෙවැනි සිදුවීම් සිදු නොවනු ඇත. වර්තමානයේදී පාඨමාලා ගාස්තු අයකර ගැනීමට සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් ශාස්ත්‍රීය කමිටුව විසින් අනුමත කර ඇත.<br><br>මෙම ශිෂ්‍යයන් බොහෝ දෙනෙකු මේ වන විට මුදල් ගෙවා ඇති අතර ඉතිරි අයට මුදල් ගෙවීම සඳහා නිවේදන යවා ඇත. ප්‍රතිඵල නිකුත් කිරීමට මුදල් ගෙවීමේ පොරොන්දුව පිට පාඨමාලා ගාස්තු ගෙවා අවසන් නොකළ ශිෂ්‍යයන්ට අවසන් පරීක්ෂණයන්ට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී තිබූ අතර මේ වන විට හිඟ පාඨමාලා ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත. එසේම බොහෝ ශිෂ්‍යයන් මුදල් ගෙවා ඇති බව පැවසුවත් නිසි පරිදි ගෙවීම් සහතික කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතු වී තිබේ. | ශිෂ්‍යයින් 05 දෙනෙක් හිඟ මුදල් ගෙවීම් සිදු කොට නොමැති අතර ඔවුන්ගේ ප්‍රතිඵල ලබා දීම් අත්හිටුවා ඇත. |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා ප්‍රවර්ධනය සඳහා පුවත්පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු. 2,670,013 ක් වැය කර තිබුණද ප්‍රධාන පුවත්පත් ප්‍රකාශන ආයතනය සමග සම්බන්ධ නොවී නියෝජිත ආයතනයක් වෙතින් දැන්වීම් පළ කරවා ගෙන තිබුණි. | සෘජුවම පුවත්පත් ප්‍රකාශන ආයතන සමග සම්බන්ධවී දැන්වීම් පළ කරවා ගන්නවාට වඩා අඩු මුදලකට පුවත්පත් නියෝජිත ආයතනය වෙත ලබා දී දැන්වීම් පළ කරවා ගැනිමට හැකි නිසා මෙසේ දැන්වීම් පළ කරවා ගෙන ඇත. එසේම දැන්වීම් ආයතනය අප විසින් ලබා දෙනු ලබන දැන්වීම් සුදුසු ලෙස සැළසුම්කරණයකටද ලක්කරනු ඇත. | වර්තමානයේ පුවත්පත් ප්‍රකාශන ආයතන සහ පුවත්පත් නියෝජිත ආයතන යන අංශ දෙකෙන්ම මිල කැඳවීම් කරනු ලැබේ. |
| | | (ඉ) | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 14 දෙනෙකු රු. 40,816 ක් වටිනා පොත් 65 ක් බාහිරට රැගෙන ගොස් අවුරුදු 01 සිට අවුරුදු 10 දක්වා ගත වී ඇතත් නැවත භාර දී නොතිබුණි. මෙම පොත් 65න් පොත් 28 ක්ම එක් ආචාර්යවරයකු විසින් රැගෙන ගොස් ඇති බව නිරීක්ෂණය වූ අතර එම පොත් සම්බන්ධයෙන් ආයතනය පසු විපරමක් කර නොතිබුණි. | පොත් භාර දී ඇත. | |
| | | (ඊ) | ආයතනය තුළ භාවිත කරන මුද්‍රණ හා ඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ සේවා ගිවිසුම් සඳහා වූ ආයතන 09 ක් වෙත රු. 155,771 ක් ගෙවා තිබුණ ද වර්ෂය තුළ සේවාවන් සිදු කරගත් බවට කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. | |

| | මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|
| | | (උ) | නිසිලෙස පුරෝකථනය කළ වැය ඇස්තමේන්තු නොමැතිව සාමාලෝචිත වර්ෂය තුළ දී රු. 180,399 ක වියදම් වෙනුවෙන් අවස්ථා 12 කදී එකතුව රු. 689,500 ක අත්තිකාරම් ලබා දී තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | අත්තිකාරම් ලබා ගන්නා නිලධාරීන් නිසි වැය ඇස්තමේන්තුවක් මත අත්තිකාරම් ලබා නොගැනීම නිසා මෙය සිදු වී ඇති අතර, වර්තමානයේ නිවැරදි වැය ඇස්තමේන්තු මත පමණක් අත්තිකාරම් දෙනු ලැබේ. | |
| 4.3 | අරමුදල් ඌන උපයෝජනය | | සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ සැළකිය යුතු ප්‍රමාණයක මුදල් ශේෂයක් අඛණ්ඩව පවත්වාගෙන යන බව නිරීක්ෂණය වුයෙන් එම මුදල් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යොදවා ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | එකඟ වේ. | |
| 4.4 | නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් | | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| | | (අ) | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 10,000,000 ක් ලැබී තිබුණු නමුත් වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන රු. 1,516,035 ක් වුයෙන් වර්ෂය සඳහා ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන රු. 8,483,965 ක් ඉතිරි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ සමුච්චිත ශේෂය රු. 24,152,861 ක් වුයෙන් රජයේ මුදල් ඵලදායි ලෙස යෙදවීමෙන් තොරව හා අඛණ්ඩව ආයතනයේ පරමාර්ථ ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය. | ආයතන ගොඩනැගිල්ල ඉදිරි ඉදිකිරීම් සඳහා මෙම මුදල් වෙන් කරවා ගෙන ලබා ගෙන ඇති අතර දිගින් දිගටම එම කටයුත්ත ආරම්භ කිරීම පමා වීම නිසා මෙම මුදල් භාවිත නොකළ නමුත් වර්තමානය වන විට එම ඉදිකිරීම් ආරම්භ කර ඇති නිසා මෙම මුදල් භාවිත කරනු ලැබේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|
| | | (ආ) දීර්ඝ කාලයක සිට ගබඩාවේ වහල අබලන් වී ගබඩාව තුළට ජලය කාන්දු වෙමින් පැවතිම හේතුවෙන් කොටසක් අතහැර දමා තිබුණි. වේයන්ගෙන් ද ගබඩාවට සැළකිය යුතු හානියක් සිදු වී තිබූ නමුත් පිළිසකර කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වර්තමානයේ ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට සැළසුම් කර ඇති බැවින් එවිට මෙය පිළිසකර කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. තවද ගබඩාව සුදුසු ස්ථානයක ස්ථාපිත කර ඇත. | |
| 4.5 | හඳුනාගන්නා ලද පාඩු | කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් කම්කරු කොමසාරිස්වරයාගේ නියෝගයට අනුව සේවකයාගේ දායකය වු රු. 243,199 ක් හා නියමිත දිනයන්හි දී දායක මුදල් නොගෙවීම නිසා අධිභාර ලෙස රු. 364,797 ක් ද සමඟ එකතුව රු. 607,996 ක් ගෙවීමට සිදු වී තිබුණි. | එකඟ වේ.<br><br>2016 වර්ෂයේ ජනවාරි මස සිට අර්ථසාධක අරමුදල් වාරික ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබේ. ඔවුන්ට අදාළ ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන "B" කාඩ්පත් ආයතනය වෙත ලැබී තිබේ. | |
| 5 | පද්ධති හා පාලනයන් | විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි. | | |
| | පද්ධති පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ | | |
| | (අ) කොන්ත්‍රාත් පාලනය | ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීම් කටයුතු සිදු නොකිරීම. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | |

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස් | 2016 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල නොකිරීම, වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇත. | |
| (ඇ) තොග පාලනය | භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබීම. | භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු යොදා ඇත. | |
| (ඈ) මුල්‍ය පාලනය | (i) සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීම. | වි.වි. මුල්‍ය චක්‍රලේඛ අංක 2015/05 යටතේ අත්තිකාරම් සීමාව නොයික්මවා කටයුතු කර ඇත. | |
| | (ii) සුළු මුදල් සීමාව පිළිනොපැදීම, රිසිට් පොත් පාලනයකින් තොරව මුදල් අයකැමි වෙත ලබා දී තිබීම, භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මුදල් ආයෝජන කර තිබීම, අනුමැතියකින් තොරව පාඨමාලා අදායම දීමනා ලෙස සේවකයන්ට ලබා දී තිබීම. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වන නිසා ආයතනයේ පවතින අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. මෙම ආයෝජනයන්ගෙන් ලැබෙන පොලිය ආයතනයේ ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාව නඩත්තු කිරීම සඳහා මුළුමනින්ම යොදවා ඇත. මෙම නිසා ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවේ කටයුතු සඳහා රජයට වැයබරක් සිදු වන්නේ නැත.<br><br>සියලුම රිසිට් පොත් ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී භාරයේ පවතින අතර ඒ සඳහා රෙජිස්ටරයක් ද භාවිත කරනු ලැබේ.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ චක්‍රලේඛ අංක 05/2015 අනුව සුළු මුදල් ප්‍රතිපාදන සීමාවන් පවත්වාගෙන යනු ලැබේ. | |